
රහස්‍යය යි

සංශෝධනයන්ට යටත්ය

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

ලකුණු දීමේ පටිපාටිය



(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

පැලවත්ත

බත්තරමුල්ල

Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැ තුනයි

I කොටසේ සියලු ප්‍රශ්නවලට ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු පත්‍ර සමග අමුණා ශාලාධිපතිට භාරදෙන්න.

විභාග අංකය :.....

I කොටස

1. (i) (අ) භාරතයේ සිවුවන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ කවර බෞද්ධ සම්ප්‍රදායයක් විසින් ද?

.....

(ආ) මේ සංගායනාවේ අනුග්‍රාහකත්වය දැරූ රජතුමා කවරෙක් ද?

.....

(ලකුණු 02 යි)

(ii) (අ) බුදුරදුන්ගේ අනුමැතිය ලැබුණු ආහාර පිළිබඳ කරුණු ප්‍රථම සංගීතියේ දී සම්මත විනයෙන් ඉවත් වී ඇතැයි ප්‍රකාශ කළේ කවරෙක් ද?

.....

(ආ) මේ කාරණය ගැන සඳහන් කරන ග්‍රන්ථ අයත් වන එක් නිකායක් නම් කරන්න.

.....

(ලකුණු 02 යි)

(iii) (අ) අර්හත් සංකල්පය යටතේ ථෙරවාද භික්ෂූන්ට පටහැනිව කරුණු ඉදිරිපත් කළ යතිවරයාණෝ කවරහු ද?

.....

(ආ) මේ යතිවරයාගේ අදහස් ප්‍රතික්ෂේප කිරීමට රචිත ග්‍රන්ථය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) නන්ද රාජවංශය යටතේ භාරතයේ පිහිටුවන ලද නිකාය කුමක් ද?

.....

(ආ) ගෝකුලික නිකාය ආරම්භ වූ බව සැලකෙන්නේ කවර රජෙකුගේ කාලයේ දී ද?

.....

(ලකුණු 03 යි)

[2 වැනි පිටුව බලන්න.

(v) (අ) අශෝක රජු සමග කුලුපගව සිටියේයැයි සැලකෙන සර්වාස්තිවාදී නිකායේ යතිවරයාගේ නම කුමක් ද?

.....

(ආ) සර්වාස්තිවාදීන්ගේ බලකොටු ලෙස සැලකෙන්නේ භාරතයේ කවර ප්‍රදේශ ද?

.....

(ලකුණු 03 යි)

(vi) (අ) ලෝකෝතරවාදයේ මූලික ඉගැන්වීම කුමක් ද?

.....

(ආ) මේ නිකායිකයන්ගේ අදහස් ඇතුළත් ග්‍රන්ථ දෙක කවරේ ද?

.....

(ලකුණු 03 යි)

(vii) (අ) ධර්මාශෝක රාජ්‍ය සමයේ දී සෝණ හා උත්තර යන තෙරවරුන් ධර්මප්‍රචාරය සඳහා වැඩම කළ රට නම් කරන්න.

.....

(ආ) මේ රටේ වර්තමාන නාමය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(viii) (අ) ධර්මාශෝක නරපතියාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය කෙබඳු වූවක් දැයි කෙටියෙන් පහදන්න.

.....

(ආ) එතුමා ක්‍රියාත්මක කළ 'ආගමික සහනසීලත්වය' මගින් නිරූපණය වන්නේ කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(ix) (අ) කණිෂ්ක රජතුමා අයත්වන වංශය කුමක් ද?

.....

(ආ) කණිෂ්ක සංගීතියේ ප්‍රමුඛත්වය දැරූ යතිවරු දෙදෙනා කවරහු ද?

.....

(ලකුණු 03 යි)

(x) (අ) 'බුද්ධවංස' නම් කෘතියට ලියූ අටුවා ග්‍රන්ථය කුමක් ද?

.....

(ආ) මේ ග්‍රන්ථයේ කතුවරයා කවරෙක් ද?

.....

(ලකුණු 03 යි)

* *

PAST PAPERS WIKI

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

S 4

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) බුදුදහමේ චිරස්තිය සඳහා අශෝක රජතුමාගෙන් සැලසුණු සේවය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) කාලිංග සංග්‍රාමයෙන් ලැබූ විජයග්‍රහණය අශෝක රජතුමා බුදුදහම වෙත ඇදීයාමට තුඩුදුන් ප්‍රධාන හේතුව ලෙස සැලකීමේ යෝග්‍යතාව විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) චක්‍රවර්ති සංකල්පය අනුව රාජ්‍ය පාලනය කළ ප්‍රථමයා ධර්මාශෝක රජු බව තහවුරු කෙරෙන සාධක ඉදිරිපත් කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) මහායාන බුදුසමයේ ආරම්භය හඳුන්වා දෙමින් හීනයාන හා මහායාන සම්ප්‍රදායයන්හි පවත්නා වෙනස්කම් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) මහායාන සම්ප්‍රදායයෙහි දැක්වෙන ප්‍රධාන මත **හතර** නම් කොට එයින් **එකක්** විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) මහායාන බුදුදහමේ ඇතුළත් 'දශභූමි' නම් වශයෙන් දක්වා එයින් **පහක්** විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) භාරතයේ වලහි විශ්වවිද්‍යාලයේ ආරම්භය හා සංවර්ධනය පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) මේ විශ්වවිද්‍යාලයේ ඉගැන් වූ අධ්‍යාපන විෂයමාලාව හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*
   (iii) හියුංසියෑං, ඉත්සිං වැනි සංචාරකයන් මේ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දියුණුව ගැන පළකරන අදහස් සමාලෝචනය කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) ථෙරවාද බුද්ධ ධර්මයේ චිරස්ථිතිය උදෙසා ක්‍රියා කළ භාරතීය පඬිවරුන් දෙදෙනෙකු ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) සූත්‍ර පිටකයට අයත් නිකාය ග්‍රන්ථවලට ලියූ අටුවා පිළිබඳව කෙටි විස්තරයක් සපයන්න. *(ලකුණු 06 යි)*
   (iii) බුද්දකනිකාය හඳුන්වා ඊට අයත් බුද්දකපාඨ, ධම්මපද හා සුත්තනිපාත යන ග්‍රන්ථ උදෙසා රචිත අටුවා ගැන කෙටි විවරණ සපයන්න. *(ලකුණු 06 යි)*

6. (i) මියන්මාරයට (බුරුමයට) බුදුසමය හඳුන්වා දීම පිළිබඳ පවත්නා කතා පුවත් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) පළමුවන විජයබාහු රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාව හා මියන්මාරය (බුරුමය) අතර පැවති බෞද්ධාගාමික සම්බන්ධතා පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) මියන්මාරයේ (බුරුමයේ) කල්‍යාණි ශිලා ලිපියෙන් හෙළිවන ඓතිහාසික වැදගත්කම විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දීමත් සමග එවකට පැවති දේශීය ඇදහිලි හා විශ්වාස බුදුදහමට අනුවර්තනය වූ ආකාරය කෙටියෙන් දක්වන්න. *(ලකුණු 06 යි)*
   (ii) පණ්ඩුකාභය රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාවේ ජෛනාගම පැවති බවට දැක්විය හැකි සාධක කවරේදැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) ජෛන ආගමට අමතරව මේ වකවානුවේ ශ්‍රී ලංකාවේ පැවති වෙනත් ආගමික ඇදහිලි විශ්වාස කෙටියෙන් විස්තර කරන්න *(ලකුණු 06 යි)*

8. (i) බුද්ධ ප්‍රතිමා වන්දනාවේ ආගමික වැදගත්කම හඳුන්වා බුදුපිළිම නිර්මාණයේ ආරම්භය පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) විවිධ ඉරියවු අනුව බුදුපිළිම වර්ග කොට ඇති ආකාරය හඳුන්වා එම පිළිම පිහිටා ඇති ශ්‍රී ලංකාවේ ඓතිහාසික ආගමික ස්ථාන නිදසුන් මගින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) බුදුපිළිම නෙළීමේ දී උපයෝග් කොට ගෙන ඇති ආසන වර්ග කවරේදැයි නිදසුන් මගින් විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

2561-බෞද්ධ ධර්මාචාර්ය විභාගය-2016-(2017)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

ලකුණු දීමේ පටිපාටිය හා යෝජිත ආදර්ශ පිළිතුරු

ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න පත්‍රයට නියමිත මුළු ලකුණු 100

I කොටස

1. ප්‍රශ්නය ලකුණු 28

(i) හා (ii) කොටස් සඳහා ලකුණු 02 බැගිනි. සෙසු ප්‍රශ්න සඳහා ලකුණු 03 බැගිනි. මේ කොටසේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වේ.

II කොටස

2 සිට 08 තෙක් ප්‍රශ්නඃ එකකට ලකුණු 18 බැගිනි. මේ කොටසේ එක් අනුකොටසකට ලකුණු 06 බැගිනි. (6 x 3 = 18))

ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු වේ. (18 x 4 = 72) ලකුණු 72

පිළිතුරු සැපයිය යුතු සියලු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

Past Papers Wiki

I කොටස

යෝජිත ආදර්ශ පිළිතුරු

1. (i) (අ) සර්වාස්තිවාදී සම්ප්‍රදාය
(ආ) කණිෂ්ක රජතුමා (ලකුණු 02 යි)

(ii) (අ) පුරාණ තෙරුන්
(ආ) ධර්මගුප්තික/ මහිංසාසක නිකාය. (ලකුණු 02 යි)

(iii) (අ) මහාදේව තෙරුන් — 1
(ආ) කථාවත්ථුප්පකරණය — 2 (ලකුණු 03 යි)

I - 1
II - 2

(iv) (අ) මහාසාංඝික නිකාය
(ආ) බින්දුසාර රාජ්‍ය සමය (ලකුණු 03 යි)

(v) (අ) උපගුප්ත හිමි
(ආ) කාශ්මීර හා ගන්ධාර (ලකුණු 03 යි)

(vi) (අ) බුද්ධ චරිතයට ලෝකෝත්තර, අතිමානුෂික තත්ත්වයක් ආරෝපණය කිරීම.
(ආ) මහාවස්තුව හා ප්‍රාතිමෝක්ෂ සූත්‍රය (ලකුණු 03 යි)

(vii) (අ) සුවණ්ණභූමි
(ආ) බුරුමය/ මියන්මාරය — 2 (ලකුණු 03 යි)

(viii) (අ) දිග්විජය ප්‍රතිපත්තිය අත හැර ධර්මය මගින් ලොව ජය ගැනීම සඳහා අනුගමනය කළ ප්‍රතිපත්ති.
(ආ) සියලු තන්හි සියලු ආගමිකයන්ට විසීමට අවස්ථාව සලසා දීම. (ලකුණු 03 යි)

(ix) (අ) කුශාන වංශය
(ආ) පාර්ශ්ව හා වසුමිත්‍ර යන තෙරවරුන් (ලකුණු 03 යි)

(x) (අ) මධුරාර්ථවිලාසිනි
(ආ) බුද්ධදත්ත හිමි. (ලකුණු 03 යි)

(මුළු ලකුණු 28 යි)

(පිටු 1-12)

II කොටස

2. (i) පහත දැක්වෙන මාතෘකා අනුව කරුණු දැක්විය හැකිය.

- ධර්මයාත්‍රා ප්‍රතිපත්තිය
- දේශ දේශාන්තරවල ධර්ම ප්‍රචාරය කරවීම
- තෙවන ධර්ම සංගායනාවට දායකත්වය ලබා දී ධර්මය ස්ථාපිත කරවීම
- දුසිල් මහණුන් සාසනයෙන් ඉවත් කර ශාසන ශෝධනය කිරීම
- තම දරුවන් දෙදෙන පැවිදි කරවීම
- දහස් ගණන් වෙහෙර විහාර කරවීම
- සෙල් ලිපි පිටුවීම මගින් ජනතාව ධර්මයට ඇයාමු කරවීම

මේ ආදි කරුණු ගැන විස්තර දැක්වීම අපේක්ෂිතයි. (පිටු 13-43) (ලකුණු 06 යි)

(ii) කාලිංග යුද්ධයේදී මිය ගිය දහස් සංඛ්‍යාත ජනතාව නිසා දැඩි ලෙස පශ්චාත්තාපයට පත් වීම

කාලිංග යුද්ධය නිසා ඇති වූ සිත්තැවුල යටපත් කර ගැනීමට බුදු දහමේ පිහිට පැතීම.

බුදුදහම වැළඳ ගත් පසු සිතේ සන්සුන් බව උදෙසා දිග් විජය ප්‍රතිපත්තිය අත හැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීම

ආගමික සහනශීලතාව ඇති කිරීම.

සතුන්ගේ ජීවිත පවා නොනැසීමට යොමු වීම, මාංසාහාර පැනවීම

සෙල්ලිපි පිහිටුවීමෙන් පවා මහජනතාව ධර්මයට නැඹුරු කරවීමට තැත් කිරීම

මේ සියලු වෙනස්කම් ඇති වූයේ රජතුමා බුදු දහම වැළඳ ගැනීමෙන් පසුවයි.

(ලකුණු 06 යි)

(iii) චක්‍රවර්ති සංකල්පය යටතේ මූලික සක්විතිවත් හතරක් වේ. එනම් දහැමෙන් සෙමෙන් රට පාලනය කිරීම, ජීවිත සුරක්ෂිතතාව තහවුරු කිරීම, ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කිරීම හා විශාරදයන්ගෙන් උපදෙස් ලබා ගැනීම යනුයි. අශෝක රජතුමා බෞද්ධයෙකු වීමෙන් පසු මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට දරූ උත්සාහය ඔහුගේ ශාසනික හා සාමාජික සේවාව තුළින් තහවුරු වේ. මේ කරුණු විස්තර කරමින් එමගින් චක්‍රවර්ති සංකල්පය ක්‍රියාත්මක කළ ආකාරය පිළිතුරෙන් තහවුරු විය යුතුය.

(පිට- 23 සිට) (ලකුණු 06 යි)

3. (i) මහායානයේ ආරම්භය ලෙස පිළිගැනෙන්නේ මහාසාංඝික වශයෙන් භික්ෂු නිකායක් බෙදී යාමයි. මේ අනුව මූලික සංඝ, ස්ථවිර වාද හා මහාසංඝික වශයෙන් බෙදී ගියේය. දෙවන ධර්ම සංගායනාව පැවති අවස්ථාවේදී වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තුව පිළිගත් විශාල භික්ෂු පිරිසක් වූහ. මේ අය සංගීතිකාරක භික්ෂු පිරිසෙන් වෙන්

වී වෙනම සංගීතියක් පැවැත් වූ බව ද ඒ නිසා මේ පිරිස මහාසාංඝික නාමයෙන් හැඳින් වූ බව ද ථෙරවාද ඓතිහාසික මූලාශ්‍රයන්හි සඳහන් වේ. ථෙරවාද සම්ප්‍රදායයේ සාමාන්‍යයෙන් ප්‍රමුඛත්වය හිමි වන්නේ භික්ෂූන් වහන්සේට ය. එහෙත් මහාසාංඝිකයන් භික්ෂූන්ට සමාන අවස්ථාවක් ගිහියන්ට ද ලබා දී ඇත.

හීනයානිකයන් ලොව්තුරා බුද්ධ, පච්චෙක බුද්ධ හා අරහත් යන තුන්තරා බෝධියෙන් එක් බෝධියකට පැමිණ නිවන් අවබෝධ කර ගැනීම ප්‍රාර්ථනාව කොට ගෙන ඇත. ථෙරවාදීන් සලකන්නේ බුදුරදුන් ඓතිහාසික උත්තම පුරුෂයෙකු වශයෙනි. එහෙත් මහායානිකයන් සලකන්නේ බුදුරදුන් අතිමානුෂික පුද්ගලයෙකු බවත් ලෝකානුවර්තනය සඳහා මෙලොව හැසිරෙන බවත් පිළිගෙන් ඇත. සසර හා නිවන යනු එකම ගමන් මගේ දෙකෙළවරකි. සියලු සසර බැඳුම්වලින් තොර වූ කල නිවන පසක් වේ. අපට පෙනෙන විෂය ලෝකය හුදු මායාවක් පමණි. විෂය-විෂයී සබඳතාව අපේ ඉන්ද්‍රියබද්ධ මනසින් සමාරෝපිත දෙයක් පමණි. ථෙරවාදීන් වඩාත් අවධාරණය කරන්නේ පුද්ගල නෛරාත්මය ගැනයි. මහායානිකයන් ධර්ම නෛරාත්මය කෙරෙහි ද අවධානය යොමු කරන බව පෙනේ.
(පිටු 51-53) (ලකුණු 06 යි)

(ii) අර්හත්ව සංකල්පය, බුද්ධ සංකල්ප, පුද්ගල නෛරාත්මය හා ධර්ම නෛරාත්මය හා ශූන්‍යතා දර්ශනය යන හතරයි. මේ පිළිබඳ විස්තර ඉහත ප්‍රශ්නයෙහි දැක් වේ.
(පිටු අංක:පිටු 51-53) (ලකුණු 06 යි)

(iii) දශභූමි: **ප්‍රමුදිතා:** ප්‍රීතිමත්, බෝධිසත්ත්වවරයෙකුට මනොප්‍රණිධියත් සමග තමා නියත වශයෙන් බුදු වන බවත් සියලු සතුන් නිවන් දැක්විය හැකි බවත් වැටහෙයි. මෙහිදී ඔහු තුළ ඇති වන ප්‍රීතිය ප්‍රමුදිතා ය.

විමලා: නිර්මල, බෝධිසත්ත්වවරයෙකු ග්‍රාම්‍ය වූ සියලු ඇවතුම් පැවතුම්වලින් තොර වෙයි. කිසිදු දූෂණයකට හසු නොවෙයි. සීලපාරමිතාව වඩාත් නිර්මල වේ.

ප්‍රභාකරී: බබළන, බෝධිසත්ත්වවරයා නොයෙක් ආකාරයෙන් බබළන්ට පටන් ගනී. ප්‍රඥාව වර්ධනය කරයි. ක්ෂාන්ති පාරමිතාව වඩයි.

අර්චිස්මතී: ඔප්නැංවෙන, මේ අවස්ථාවේදී බෝසත්තුමා බෝධිසත්ත්ව ධර්මවලින් දීප්තිමත් වේ. ලෝකය පිළිබඳ නිවැරදි දැක්මක් ලබයි. ප්‍රඥා පාරමිතාව ප්‍රබලව වඩයි.

සුදුර්ජයා: අත් කර ගැනීමට දුෂ්කර, හිත මනාව පාලනය කරමින් මේ අවස්ථාවේදී බෝසත්තුමා බුද්ධකාරක ධර්ම සම්පූර්ණ කර ගනී. ශූන්‍යතාවට අවබෝධ කර ගනී. ධ්‍යාන පාරමිතාව වඩාත් ශක්තිමත්ව සම්පූර්ණ කරයි.

අභිමුඛී: මුහුණට මුහුණ ලා සිටින, ප්‍රඥාව දියුණු කර ගනිමින් ලොව පිළිබඳ යථාභූත ඥානය ලබා ගනී.

දූරංගමා: ඈත ගමන් කරන, කය, සිත හා වචනය වඩාත් පිරිසිදු කර ගනී. සුරැකිය යුතු විනය සම්පූර්ණ කර ගනී.

අචලා: නිශ්චල, විශ්වයේ විකාශය පිළිබඳ අවබෝධ කර ගනී. බුදුබව සඳහා අමුතු ප්‍රයත්නයක් නොදරන අර විශ්ව මෛත්‍රිය පතුරුවයි.

සාධුමතී: යහපත් අදහස් ඇති, සියලු ලෞකික-ලෝකෝත්තර ධර්ම අවබෝධ කොට ගනී. අනුන්ට ධර්මය අවබෝධ කර දීමට සමත් වෙයි.

ධර්ම මේඝා: දහම් වලාකුළක් වැනි, බෝසත්තුමා දහම් වැසි වස්සවයි. සියලු සතුන්ගේ කෙලෙස් ගිනි නිවාලයි. තථාගත භූමියට පත්ව සිටියි. (පහක් විස්තර කිරීම ප්‍රමාණවත්ය)

(පිටු 67-69) (ලකුණු 06 යි)

4. (i) වලභී: ආරම්භය- ක්‍රි. ව. 475-775 අතර කාලය තුළ විසූ මෛත්‍රක රජවරුන් ඉන්දියාවේ බටහිර ප්‍රාන්තය පාලනය කරමින් එහි අගනුවර වූ වලභියෙහි ඉදි කළ මහා විහාරයෙහි මේ විශ්ව විද්‍යාලය ආරම්භ කෙරිණ. නාලන්දා විශ්ව විද්‍යාලය තරමට ප්‍රසිද්ධ වූ ආයතනයකි. ශ්‍රාවක යානයේ කේන්ද්‍රස්ථානය විය. මේ ආයතනය දියුණු කිරීම සඳහා මෛත්‍රක රජවරු මුදල් වැය කොට ඇත. විදේශයන්හි පවා කීර්තිය පැතිර ගියේය. ක්‍රි .ව. හත් වන සියවසේදී මෙය නාලන්දාව හා සම තත්ත්වයට පත් විය. හියුංසියෑං සඳහන් කරන ආකාරයට මෙහි සංඝාරම 100ක් විය. භික්ෂූන් 6000ක් වැඩ සිට ඇත. විදේශ ශිෂ්‍යයෝ ද මෙහි උගත්හ.

(ii) විෂය ධාරාව. සම්මිතීය විනය ඉගැන්වීමට ප්‍රමුඛත්වයක් හිමි විය. බුද්ධ ධර්මය තුලනාත්මකව හැදෑරීම කෙරෙහි යොමු විය. ආගමික විෂය ධාරාවට අමතරව ලෞකික විෂය ධාරාව ද ඉගැන්විණ. මේ යටතේ චතුර්වේදය, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් ආදි කොට ඇති හින්දු දර්ශනය පුළුල්ව ඉගැන් වූ අතර හින්දු ධර්ම ශාස්ත්‍ර, දේශපාලන විද්‍යාව, වාණිජ විද්‍යාව, කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව, ආදි ලෞකික විෂයයන් ද උගන්වා ඇත. (පිටු 92-95) (ලකුණු 06 යි)

(iii) හියුංසියෑං- ජනගහනය අධික, ධනවතුන්ගෙන් පිරුණු ප්‍රදේශයකි. විදේශවලින් ආනීත භාණ්ඩ මෙහි ඇත. භික්ෂූන් 6000ක් පමණ වසන සංඝාරාම 100ක් ඇත. භික්ෂූන්ගෙන් වැඩි දෙනෙක් සම්මිතීය නිකායට අයත්ය. මෙහි වැඩි අවධානය යොමු වූයේ ශ්‍රාවකයාන බුදුදහම කෙරෙහිය.

ඉත්සිං- දේශීය මෙන්ම විදේශීය ශිෂ්‍යයන් ද මෙහි ඉගෙන ගෙන ඇත. නාලන්දා විශ්ව විද්‍යාලය තරම් ප්‍රසිද්ධය. සම්මිතීය නිකායයේ අදහස් පුළුල් වශයෙන් මෙහි ඉගැන්විණ.

(පිටු අංක 92-95) (ලකුණු 06 යි)

5. (i) නාගසේන හිමි- මිළිඳු රජු සමඟ වාද කොට ඔහුගේ අදහස් ඛණ්ඩනය කර ඇත. මේ වාද ඇතුළත් කෘතිය මිළින්ප්‍රශ්නයයි. මේ හිමි ධම්මරක්ඛිත හිමියන්ගේ ශිෂ්‍යයෙකි. ත්‍රිපිටක ධර්මය කටපාඩමින් කීමට සමත් විය.

පේටකෝපදේශය හා නෙත්තිප්පකරණය රචනා කළැයි සැලකෙන මහාකාත්‍යායන හිමි ද ථෙරවාදී පඬිවරයෙකි. මෙහි ථෙරවාද බුදුදහම විභජ්ජවාදී ක්‍රමයට අර්ථ විවරණය කොට ඇත.
බුද්ධඝෝෂ, බුදුධදත්ත හා ධම්මපාල යන තෙරවරුන් ගැන ද විස්තර ඇත් නම් සලකා බැලිය හැකිය.
(පිටු 102-108) (ලකුණු 06 යි)

(ii) බුද්ධඝෝෂ හිමියන් සූත්‍ර පිටකයේ දීඝනිකායට සුමංගල විලාසිනී ග්‍රන්ථය ලියා ඇත. මජ්ඣිම නිකායට ලියා ඇත්තේ පපංච සූදනියයි. සංයුත්ත නිකායට ලියූවේ සාරත්ථප්පකාසිනියයි. අංගුත්තර නිකායට මනෝරථපූරණිය ලියා ඇත.
(පිටු 104-107) (ලකුණු 06 යි)

(iii) බුද්දක නිකාය යනු කුඩා නිකායයි. මෙය ග්‍රන්ථ කීපයකින් සමන්විත වේ. මුළු ග්‍රන්ථ සංඛ්‍යාව 18 කි. බුද්දක නිකායට අයත් බුද්දක පාඨ සඳහා පරමත්ථජෝතිකාව ද ධම්මපදය සඳහා ධම්මපදට්ඨකථාව ද සුත්තනිපාතය සඳහා පරමත්ථජෝතිකාව ද ජාතක සඳහා ජාතකට්ඨකථාව ද බුද්ධඝෝෂ හිමියෝ රචනා කළහ. (පිටු 105) (ලකුණු 06 යි)

6. (i) තෙවන ධර්ම සංගායනාවෙන් පසු සෝණ හා උත්තර තෙරවරුන් මියන්මාරයට බුදුදහම හඳුන්වා දුන් බව එක් මතයකි. මේ අතර තපස්සු හල්ලික වෙළඳ දෙබෑයන් බුදුරදුන්ගේ කේශධාතු තැන්පත් කොට චෛත්‍යයක් කරවූ බවත් එය වර්තමාන ස්වේදගොන් චෛත්‍යය බවත් සැලකීම තවත් මතයකි. එසේම වෙළඳුන් දෙදෙනෙකු බුරුමයේ ගමක සඳුන් ලීයෙන් පන්සලක් තැන වූ බවත් බුදුරදුන් එහි කෝලයක් වැඩ විසූ බවත් තවත් මතයකි. තායිලන්තය ඔස්සේ මියන්මාරයට බුදුදහම පැමැණි බව තවත් මතයකි.
(පිටු 120-21) (ලකුණු 06 යි)

(ii) මේ යුගයේදී බුරුමයේ අනෞරථ රජතුමා දූත පිරිසක් යවා ලංකාවෙන් බෞද්ධ ධර්ම ග්‍රන්ථ ගෙන්වා ගත්තේය. ඡප්පට හා උත්තරජීව යන භික්ෂු දෙනම මේ කාලයේදී ලංකාවට පැමිණ මහාවිහාරයේ නැවතී බුදුදහම හදාළහ. ඡප්පට හිමියෝ වසර දහයක් පමණ ලංකාවේ රැඳී සිටියහ. මේ හිමිවරු පෙරළා බුරුමයට වැඩමවා "සීහලසංඝ" නමින් නව නිකායක් ආරම්භ කළහ. අග්නිදිග ආසියාවේ බුදුදහම පැතිරවීමට මේ නිකාය බෙහෙවින් උපකාරී විය.
(පිටු 123) (ලකුණු 06 යි)

(iii) කල්‍යාණි ශිලාලිපිය අයත් වන්නේ ලංකාවේ සිවු වන බුවනෙකබා රාජ්‍ය සමයටයි. මෙහි දැක්වෙන පරිදි භික්ෂූන් දෙවිසි නමක් ලංකාවට පැමිණ රාජානුග්‍රහය යටතේ කල්‍යාණ සීමාමාලකයේදී උපසම්පදාව ලබා ඇත. මේ පිරිස පෙරළා බුරුමයට වැඩමවා කල්‍යාණි

සීමාමාලකයක් එහි පහිටුවා බැරුම භික්ෂූන් සියලු දෙන නැවත උපසම්පදා කළ බව සැලකේ. මේ කරුණු ඇතුළත් වන්නේ කල්‍යාණී ශිලිලිපියේය.

(පිටු 124) (ලකුණු 06 යි)

7. (i) ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දීමේදී දේශීය ඇදහිලි හා විශ්වාස කීපයක්ම විය. යක්ෂයන්, වෘක්ෂ දේවතාවන්, ඉටුදෙවියන්, මළගියවුන් වැනි අය මේ ගණයට ඇතුළත් විය. මේ ඇදහිලි ප්‍රාථමික යුගයේ පැවති ඒවා විය. මිහිඳු හිමියන් විමාන වත්ථු, පේත වත්ථු වැනි දේශනා මගින් මේ ඇදහිලි බුදුදහමට අනුවර්තනය කිරීමට උත්සාහ ගත්හ. එසේම බෝධි වන්දනාව, ස්තූප වන්දනාව මගින් මේ ඇදහිලිවලට බෞද්ධ ස්වරූපය ලබා දුන්හ.

(පිටු 132-158) (ලකුණු 06 යි)

(ii) පණ්ඩුකාභය රාජ්‍ය සමයේදී ජෝතිය, ගිරි, කුම්භාණ්ඩ යන නම් ඇති නිගණ්ඨයන් තිදෙනෙකු විසූ බව මහාවංසයෙහි සඳහන් වෙයි. රජතුමා මේ නිගණ්ඨයන්ට වාසස්ථාන ඉදි කොට දී ඇත. අනුරපුර මහාවිහාර සීමාව නියම කිරීමේදී මේ ආරාම ද ඇතුළු කොට ඇත. බල්ලාටනාග රාජ්‍ය සමයෙහි ද ජෛනාගම ඇදහූ පිරිස් සිටි බව සිතිය හැකිය. මේ යුගයෙහි රාජකුමාරවරුන් තිදෙනෙකු රාජ්‍යය ගැනීමට උත්සාහ කොට අසාර්ථකව ජෛන ක්‍රමයට සිය දිවි නසා ගෙන ඇත. ක්‍රි. ව. පස් වන සියවසේදී මුගලන් කුමරු වරපුරුෂයන් වශයෙන් ජෛන භික්ෂූන් යොදා ගෙන ඇත. පණ්ඩුකාභය රාජ්‍ය සමයේ විසූ ගිරි නිගණ්ඨයාගේ ආරාමය ගැන තොරතුරු වළගම්බා රාජ්‍ය සමය පිළිබඳ විස්තරවලදී ද දක්නට ලැබෙයි. රජතුමා යුද්ධයෙන් පැරදී යන කල්හි මොහු රජුට සරදම් කිරීම් වශයෙන් "මහ කළු සිංහලයා දුවන බව පවසා කෑ ගසා ඇත" මේ අනුව ජෛන ඇදහිලි හා විශ්වාස පැවති බව හෙළි වේ.

(පිටු 166) (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ වෙනත් ඇදහිලි විශ්වාස අතර බ්‍රාහ්මණ ආගම, ආජීවක, පරිබ්බාජක ආගම් ද යක්ෂයන්, වෘක්ෂ දේවතාවන්, ඉටු දෙවියන් හා මළවුන් ඇදහීම ද ශිව ලිංග පූජාව ද වෙනත් ශ්‍රමණයන් හා පාෂාණ්ඩයන් ද මෙහි සිටි බවට සාධක ඇත. මෙයින් කීපයක් ගැන හෝ විස්තර දැක්වීම අවශ්‍ය වේ.

(පිටු 161-167) (ලකුණු 06 යි)

8. (i) බෞද්ධයන්ගේ වන්දනාවට සුදුසු ශාරීරික, උද්දේශික හා පාරිභෝගික වශයෙන් ත්‍රිවිධ චෛත්‍ය ගැන බෞද්ධ සාහිත්‍යයෙහි කරුණු දක් වේ. බුදු පිළිම උද්දේශික පූජා ගණයට වැටේ. බුදු පිළිම නිර්මාණය ගැන මුල්ම සාධක හමු වන්නේ කණිෂ්ක යුගයේදීය. ඔහු විසින් බුදු පිළිම යෙදූ කාසි හා බුදු රූ සහිත කරඬු ද නිර්මාණය කළ බවට සාධක ඇත. අනතුරුව ගන්ධාර, මථුරා හා ආන්ධ්‍ර

Past Papers Wiki

සම්ප්‍රදාය අනුව බුදු පිළිම නිර්මාණය ව්‍යාප්ත වූ බව සැලකේ. මේ කරුණු ගැන විස්තර දැක්වීම අවශයි.

(පිටු 222-226) (ලකුණු 06 යි)

(ii) හිඳි පිළිම, හිටි පිළිම හා සැතපෙන පිළිම වශයෙන් වර්ග තුනක් ගැන තොරතුරු ඇත. පිදුරන්ගල විහාරයේ පැරණි සැතපෙන පිළිමයක් ඇත. හැබැස්ස පිළිමය ද එවැන්නකි. අවුකන හා සැස්සේරු යන තන්හි හිටි පිළිම දක්නට ලැබේ. මහමෙව්නාවේ සමාධි පිළිමය, කොළඹ කෞතුකාගාරයේ සමාධි පිළිමය ආදිය හිඳි පිළිමවලට නිදසුන්ය.

(පිටු 227) (ලකුණු 06 යි)

(iii) පද්මාසන, වීරාසන, භද්‍රාසන හා වජ්‍රාසන වශයෙන් ආසන වර්ග හතරක් ගැන තොරතුරු දැක් වේ. පද්මයක් ආකාරයට හිඳ ගැනීම පද්මාසනයයි. ධ්‍යානාසන හා කමලාසන නම් ද මේ සඳහා යෙදේ.

කලවා එකට තැබූ විට වම් පාදය දකුණු පාදය යටින් හා දකුණු පාදය වම් පාදය උඩින් සිටිනා සේ තබා හිඳ ගැනීම වීරාසනයයි.

තරමක් උසට තනන ලද විශේෂ ආසනයක් මත හිඳ කලවා දෙපසට විහිදුවා ආසනයෙන් පහත වැටෙන පා දෙක පීඨයක් මත සිටින අයුරින් නිර්මිත වූයේ භද්‍රාසනයයි.


දණහිස නවා දෙපතුල් උඩු අතට දෙකලවා මත තබා ඒ මත දෙඅත්ල තබා සිටීම වජ්‍රාසන ක්‍රමයයි.

■■■■■

PAST PAPERS WIKI



ශ්‍රී ලංකා
විභාග දෙපාර්තමේන්තුව



ලකුණු දීමේ පටිපාටිය

බෞද්ධ ධර්මාචාර්ය විභාගය 2017 (2018)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය.

සංකේත අංකය

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී වුවමනාවන අයුරු අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද, **II** වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. **I** කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, **II** කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාරදෙන්න.

විභාග අංකය :.....

I කොටස

1. (i) (අ) ථෙරවාද සම්ප්‍රදාය අනුව භාරතයේ පැවැත්වූ සංගායනා ගණන කීය ද?

.....

(ආ) මෙයින් දෙවන සංගායනාව පවත්වන ලද්දේ කවුරුන්ගේ මතවාද බණ්ඩනය කිරීම සඳහා ද?

.....

(ලකුණු 02 යි)

(ii) (අ) ප්‍රථම සංගීතියේ දී සාකච්ඡාවට භාජනය වූ ඉතා වැදගත් ගැටලුව කුමක් ද?

.....

(ආ) මේ නිසා විනය සංශෝධන අපේක්ෂා කළ පිරිස් නැඹුරු වී සිටියේ කවර අරමුණක් සඳහා ද?

.....

(ලකුණු 02 යි)

(iii) (අ) 'මහාසංගීති' නමින් නව සංගායනාවක් පැවැත්වූයේ කවර කරුණක් මුල් කොට ගෙන ද?

.....

(ආ) මේ කරුණ ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) සම්මිතීය නිකායයේ ඉතිහාසය ලියන ලද්දේ කවරෙකු විසින් ද?

.....

(ආ) මේ නිකායේ වැඩි අවධානයක් යොමු වූයේ කවර සංකල්පයක් සඳහා ද?

.....

(ලකුණු 03 යි)

[2 වැනි පිටුව බලන්න.

(v) (අ) ධර්මාශෝක රාජ්‍ය සමයට පෙර තෙරවාද සම්ප්‍රදායයෙන් බෙදී ගිය නිකාය කුමක් ද?

.....

(ආ) මේ කාලය තුළ මහාසාංඝිකයන්ගෙන් බෙදී ගිය නිකාය දෙක කවරේ ද?

.....

.....

(ලකුණු 03 යි)

(vi) (අ) පංචස්කන්ධය හුදෙක් ගිනි අඟුරු ගොඩක් ලෙස උගන්වන ලද්දේ කවර නිකායයක් මගින් ද?

.....

(ආ) ලොව පවත්නා සියලු දේ හුදු නාමමාත්‍ර හා සංකල්ප පමණක් බව ඉගැන්වූවෝ කවරහු ද?

.....

(ලකුණු 03 යි)

(vii) (අ) මාඝාත' නීතිය පැනවූ භාරතීය රජතුමා කවරෙක් ද?

.....

(ආ) මාඝාත' යන්නෙහි අර්ථය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(viii) (අ) අශෝක අධිරාජයාගේ අනුශාසනා භාරතීය ජනතාව අතර ප්‍රචාරය කිරීමට යෙදූ උපාය මාර්ගය කුමක් ද?

.....

(ආ) එම උපාය මාර්ගය අනුව ස්වකීය අනුශාසනා ප්‍රදර්ශනය කිරීමට රජතුමා යෙදූ ක්‍රමවිධි කවරේ ද?

.....

.....

.....

(ලකුණු 03 යි)

(ix) (අ) භදන්ත අශ්වඝෝෂ හිමියන් ජීවත් වූයේ කවර රාජ්‍ය සමයක දී ද?

.....

(ආ) භදන්ත අශ්වඝෝෂ හිමියන් සැලකෙන්නේ කවර බෞද්ධ නිකායකට අයත් වූවකු ලෙස ද?

.....

(ලකුණු 03 යි)

(x) (අ) සමන්තපාසාදිකා විනය අටුවාව ලිවීමට ආරාධනා කළේ කවුරුන් විසින් ද?

.....

(ආ) මේ කෘතියේ කතුවරයාගේ නම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018) **S 4**

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) බුදු දහමේ ඉගැන්වෙන ඇතැම් කරුණු අශෝක අධිරාජයා විසින් සිය පාලන ප්‍රතිපත්ති සඳහා උපයෝගි කරගත් අයුරු එතුමාගේ සෙල්ලිපි ඇසුරෙන් සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ශ්‍රී ලංකාවට බුදුදහම ලැබුණේ මෙරට පාලකයන් හා භාරතයේ අශෝක අධිරාජයා අතර පැවති සංස්කෘතික සම්බන්ධතාවල ප්‍රතිඵලයක් වශයෙන් බව සනාථ කෙරෙන සාධක ඉදිරිපත් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ශ්‍රී ලංකාවේ බුදුදහම පිහිටුවීම හා ආශ්‍රිතව පවත්නා ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) මහායාන බුදුසමයෙහි ඇතුළත් බෝධිසත්ත්ව සංකල්පය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) 'බෝධි චිත්තය' යනු කුමක් දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මහායාන බුදුසමයෙහි දැක්වෙන අමිතාභ බුද්ධ වන්දනාව පිළිබඳ ව විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) භාරතයේ නාලන්දා විශ්වවිද්‍යාලයේ ආරම්භය හා සංවර්ධනය පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) නාලන්දා විශ්වවිද්‍යාලයේ ප්‍රවේශ පරීක්ෂණයේ ස්වරූපය කෙබඳු වී දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(iii) නාලන්දා විශ්වවිද්‍යාලයේ ඉගැන්වූ විෂයධාරා පහ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) 'හෙළටුවා' යනු කවරේ දැයි හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(ii) බුද්ධදත්ත හිමියන් විසින් ලියන ලද අටුවා හා අනෙකුත් ග්‍රන්ථ පිළිබඳ සමාලෝචනයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) පෙළ පොත්වලට පසුව රචනා කළ වැදගත් පාලි ගද්‍ය ග්‍රන්ථ දෙකක් ගැන විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ජපානයේ පැතිර ගිය නිචිරෙන් නිකාය ගැන විස්තරයක් සපයන්න. *(ලකුණු 06 යි)*

(iii) සෙන් බුදුසමයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

7. (i) ලක්වැසියන් අතර පැතිර ගිය ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය පොදුජන විශ්වාසවලට අනුකූලව ක්‍රමයෙන් හැඩගැසුණු ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ශ්‍රී ලංකාවේ අනුරාධපුරයෙන් ආරම්භ වූ බුදුසමය රෝහණ ජනපදය තෙක් පැතිර යාමට බල පෑ හේතු සාධක විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) දුටුගැමුණු රජුගේ දේශපාලන කාර්යයේ සඵලතාව සඳහා අදාළ පසුබිම කාවන්තිස්ස රජතුමා විසින් සකස් කළ බවට දැක්විය හැකි හේතු සාධක කවරේ දැයි පිරික්සන්න. *(ලකුණු 06 යි)*

8. (i) බෞද්ධ ස්තූප නිර්මාණය ආරම්භයේ දී හා පරිණාමයේ දී දක්නට ලැබුණු විශේෂතා මොනවා දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) වටදා ගෙය හඳුන්වා, ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වටදා ගෙවල් පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) බෞද්ධ ස්තූප වර්ග නම් කොට, ඒවායින් හතරක ආකෘතික ලක්ෂණ හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

* * *

PAST PAPERS WIKI

ලකුණු දීමේ පටිපාටිය හා යෝජිත ආදර්ශ පිළිතුරු

ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න පත්‍රයට නියමිත මුළු ලකුණු 100

I කොටස

1. ප්‍රශ්නය ලකුණු 28

(i) හා (ii) කොටස් සඳහා ලකුණු 02 බැගිනි. සෙසු ප්‍රශ්න සඳහා ලකුණු 03 බැගිනි. මේ කොටසේ සියලු ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතු වේ.

II කොටස

2 සිට 08 තෙක් ප්‍රශ්න එකකට ලකුණු 18 බැගිනි. මේ කොටසේ එක් අනුකොටසකට ලකුණු 06 බැගිනි. (ලකුණු 06 x 03 = 18යි.)

ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු වේ. (18 x 04 = 72යි.) ලකුණු 72

පිළිතුරු සැපයිය යුතු සියලු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.

I කොටස

යෝජිත ආදර්ශ පිළිතුරු.

01.

(i.) (අ) ථෙරවාද සම්ප්‍රදායට අයත් සංගායනා - **තුනයි.**

(ආ) දෙවන සංගායනාව පැවැත්වූයේ - **වජ්ජිපුත්තක භික්ෂූන්ගේ මතවාද බණ්ඩනය සඳහා.**

(ලකුණු 01 + 01 = 02යි.)

(ii.) (අ) ප්‍රථම සංගීතියේදී සාකච්ඡා කළ කරුණු - **බුද්ධානුබුද්ධක ශික්ෂා පද.**

(ආ) විනය සංශෝධක පිරිස් නැඹුරු වී ගියේ - **අභිනව නිකායක් ආරම්භ කිරීමට**

(ලකුණු 01 + 01 = 02යි.)

(iii.) (අ) මහාසංගීති නව සංගායනාව පැවැත්වූයේ - **පංචවස්තුව අරබයා**

(ආ) මේ කරුණ ඉදිරිපත් කරන ලද්දේ - **මහාදේව තෙරුන්**

(ලකුණු 02 + 01 = 03යි.)
01 + 02

(iv.) (අ) සම්මිතීය නිකායේ ඉතිහාසය ලියූයේ - **භාවිවේචික**

(ආ) මේ නිකායේ වැඩි අවධානය යොමු වූයේ - **පුද්ගල සංකල්පය උදෙසා.**
02 01

(ලකුණු 01 + 02 = 03යි.)
01 - 02

(v.) (අ) ධර්මාශෝක සමයට පෙර ථෙරවාද සම්ප්‍රදායෙන් බෙදී ගියේ - **වාත්සීපුත්‍රයන්**

(ආ) මහාසාංඝිකයන්ගෙන් බෙදී ගිය නිකාය දෙක - **ඒකබ්බොහාරික හා ගොකුලික.**
02 01

(ලකුණු 01 + 02 = 03යි.)
01 - 02

(vi.)(අ) පංචස්කන්ධය ගිනි අඟුරු ගොඩක් ලෙස සැලකුයේ - ගොකුලිකයන්

(ආ) ලොව සියලු දේ සංකල්ප පමණක් බව ඉගැන්වූයේ - ඒකබොහාරිකයන්.

(ලකුණු 02 + 01 = 03යි.)
01 + 02

(vii.)(අ) මාඝාත නීතිය පැණ වූ රජතුමා - **ධර්මාශෝක**

(ආ මාඝාත යනු - **සතුන් නොමැරීමයි**

(ලකුණු 01 + 02 = 03යි.)
01 + 2

(viii.) (අ) අශෝක අධිරාජයාගේ අනුශාසනා ජනතාව අතර ප්‍රචාරය කළේ - **සෙල්ලිපි මඟිනි.**

(ආ) මේ අනුව තම අනුශාසනා ප්‍රචාරයට යොදා ගත් අංශ - **ගිරිලිපි, පර්වතලිපි, ස්තම්භලිපි.**

(ලකුණු 01 + 02 = 03යි.)

(ix.) (අ) අශ්වඝෝෂ හිමි ජීවත් වූයේ - **කණිෂ්ක රාජ්‍ය සමයේ.**

(ආ) උන්වහන්සේ අයත් නිකාය - **සර්වාස්තිවාදය.**

(ලකුණු 01 + 02 = 03යි.)

(x.) (අ) සමන්තපාසාදිකාව ලිවීමට ආරාධනා කළේ - **බුද්ධසිරි තෙරුන්**

(ආ) මේ කෘතියේ කතුවරයා - **බුද්ධඝෝෂ හිමි**

(ලකුණු 02 : 01 + 01 = 02යි.)

01+02

II කොටස

02.

(I) අශෝක රජතුමාගේ ධර්ම විජය, සුභසාධනය, ආගමික සහනශීලතාව, ධර්මයාත්‍රා යන ප්‍රතිපත්ති ද දේශීය හා නවරට ධර්ම ප්‍රචාරක කටයුතු ද ගැන විස්තර ඉදිරිපත් කිරීම මෙහිදී අපේක්ෂිතයි. (පිටු අංක 13 - 43) සොල්දිලි නම්බර්මය - 02

(ලකුණු 06යි.)

(II) ශ්‍රී ලාංකේය පාලකයන් හා අශෝක රජතුමා අතර කිසියම් කාලයක් තුළ සංස්කෘතික සබඳතා පැවති බවට කරුණු ඇත. මහින්දාගමනයට පෙර අරිට්ඨ ඇමති ප්‍රධාන දූත පිරිසක් අශෝක අධිරාජයා හමුවට ගොස් තිබීම, පඬුරු හුවමාරු කර ගැනීම, ලිපි ගනුදෙනු කිරීම දෙවන පෑතිස් රජුගේ අභිෂේකය උදෙසා අවශ්‍ය කකුධ භාණ්ඩ අශෝක රජු විවීම, මිහිඳු හිමියන් ඇතුළු දූත පිරිස දෙවන පෑතිස් රජු විසින් හඳුනාගෙන බුදුදහම වැලඳ ගැනීම ආදී තොරතුරු දැක්වීම අවශ්‍ය වේ. (පිටු අංක 40 - 41)

කරුණු 3 ක් 1 X 2 = 06

(ලකුණු 06යි.)

(III) * සාංචි දෙවන ස්තූපයෙහි කරඬුවල මහතෙරවරුන්ගේ ධාතු තැන්පත් කොට අදාළ නම් සඳහන් කොට තිබීම. නිදසුන් වශයෙන් සපුරිස මජ්ජිම (මජ්ඣන්තික තෙරුන්) සපුරිස කසප ගොතස හෙම වතා චරියස (කස්සපගොත්ත තෙරුන්), දදහිසාර ගොවිපුත්ත (දුන්දුභිස්සර තෙරුන්) ගැන සඳහන් වේ. මේ සියලු දෙනා විවිධ ප්‍රදේශවලට වැඩිය ධර්ම දූතයන් වහන්සේලාය.

* ශ්‍රී ලංකාවෙන් හමු වූ ක්‍රි.ව. 1 සියවසට අයත් සෙල්ලිපියක ඉදික තෙරහ, මහිද තෙරහව යන නම් දක්නට ලැබේ.

* පාලි අට්ඨකථා හා වංශකථාවල ද මිහිඳු හිමියන්ගේ ශ්‍රී ලංකාගමනය ගැන විස්තර දක්නට ලැබේ. මේ අනුව මිහිඳු හිමියන් ලංකාවට බුදුදහම රැගෙන පැමිණි බව තහවුරු වේ. (පිටු අංක 41 - 43)

(ලකුණු 06යි.

1 X 2 = 06.

03.

(I) බෝධිසත්ත්ව සංකල්පය : ධර්මාවබෝධය ලැබීමෙහි ඇළුණු පුද්ගලයා යන අර්ථය මෙයින් ලැබේ. බෝධි චිත්තය ලැබීමෙන් පසු බෝධිසත්ත්වයන්ගේ ශරීරය පූජාර්හ වස්තුවක් බවට පත් වේ. මහායාන සූත්‍ර වල දැක්වෙන පරිදි ධ්‍යානී බෝධිසත්ත්වවරු අට දෙනෙක් වෙති. බෝධිසත්ත්වවරයෙකු බුද්ධත්වය ලැබීමට පෙර පත්විය යුතු අවස්ථා දහයක් ඇත. මේවා දසභූමි නමින් හැඳින්වේ. පාරමිතා සම්පූර්ණ කළ යුතු වේ. මහාකරුණාව හා මහාප්‍රඥාව සම්පූර්ණ කළ යුතු වේ. (පිටු අංක 63 - 70)

(පූර්ණ විස්තරයක් සඳහා ලකුණු 06යි. සාමාන්‍ය පිළිතුරක් සඳහා යෝග්‍ය පරිදි ලකුණු දෙන්න.)

(II) බෝධි චිත්ත යනු බුදු බව ප්‍රාර්ථනා කරන සියලු බෝධිසත්ත්වවරුන් විසින් වැඩිය යුතු දෙයකි. එනම් සියලු සත්ත්වයන් සංසාරයෙන් ගොඩ නංවනු පිණිස මම බුදු වෙම්වා යන ප්‍රාර්ථනයයි. බෝධිචර්යාවතාරයෙහි මේ ගැන දීර්ඝ විස්තරයක් ඇතුළත් ය. මේ අනුව බෝධි චිත්තය ලෝකයාගේ මරණ දුක නැති කිරීමේ රසායනයකි. ලෝකයාගේ ව්‍යාධීන් සංසිඳුවන උතුම් ඖෂධයකි. සියලු දෙනාට දුගති නැමති මුහුදින් එතර වීමට පිහිට වන නිසා නිදණ්ඩකි ලෝකයාගේ මෝහාන්ධකාරය දුර ලන මහා සූර්යයෙකි. දිගු කලක් පවත්නා අන්‍යයන්ට සැපත් ලබා දෙන යාගයක් බඳුය. (පිටු අංක 57 - 59)

(ලකුණු 06යි.)

(III) අමිතාභ බුද්ධ වන්දනාව යනු ගෞරවාදර භක්තියෙන් යුතුව එම බුදුන් වන්දනා කිරීමයි. මේ අනුව නමෝ අමිත බුත්සු යන පාඨය ජප කිරීම මඟින් විමුක්තිය ලද හැකිය යන විශ්වාසය මහායාන බෞද්ධයන් අතර පවති. මේ ඇදහීම පාදක කර ගත් වෙනම නිකායයක් ජපානයේ පවති. චීනයේද මේ ඇදහීම පැතිරී ඇත. (පිටු අංක 61)

(ලකුණු 06යි.)

04.

(I) **නාලන්දා විශ්ව විද්‍යාලයේ ආරම්භය හා සංවර්ධනය** - ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයට අයත් විශ්ව විද්‍යාලයකි. මේ විශ්ව විද්‍යාලය පළමු වන කුමාරගුප්ත රජතුමා (ක්‍රි.ව 415 - 455) විසින් ගොඩනංවන ලදී. බුද්ධගුප්ත, තථාගතගුප්ත, බාලාදිත්‍ය හා වජ්‍ර රජුන් විසින් වර්ධනය කරන ලදී. මෙය නේවාසික සරසවියකි. මෙහි නිවැසි භික්ෂු සංඛ්‍යාව දස දහසකට නොඅඩු විය. හියුංසියෑං වැනි චීන සංචාරක භික්ෂූන් විසින් මේ ආයතනයේ දියුණුව විස්තර කර ඇත.. (පිටු අංක 73 - 77)

(ලකුණු 06යි.)

(II) **ප්‍රවේශ පරීක්ෂණය** - මෙහි පැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව විශාල වූ නිසා ප්‍රවේශය ඉතා තරඟකාරී විය. විශ්ව විද්‍යාලයේ ඉගෙනීමට එන අපේක්ෂකයා දොරටු අසල වූ තෙමහල් ද්වාර මන්ද්‍රිරයෙහි නතර විය යුතුය. ප්‍රවේශ පරීක්ෂණය මෙහිදී පැවැත්විණ. ධර්ම ශාස්ත්‍රයන්හි නිපුණ විවාදයන්හි ප්‍රවීණ පඬිවරු අපේක්ෂකයන් පරීක්ෂා කළහ. මේ පරීක්ෂණයෙන් සමත් වූයේ ටික දෙනෙකි.
(පිටු අංක 77 - 78)

(ලකුණු 06යි.)

(III) **ඉගැන් වූ විෂය ධාරාව** - මේ විෂය ධාරා පහක් විය.

1. භාෂා අධ්‍යයනය - මේ යටතේ සංස්කෘත භාෂාව හා වියට අදාළ වාග්විද්‍යාව, ඡන්දස්, ව්‍යාකරණ, අලංකාර, නිරුක්ති ආදිය විය.
2. බුද්ධධර්ම අධ්‍යයන - මේ යටතේ මහායානය හා අනෙකුත් බෞද්ධ නිකාය වලට අයත් දර්ශන උගත යුතු විය.
3. දර්ශන අධ්‍යයන - වෛදික, සාංඛ්‍ය, යෝග, න්‍යාය, වෛශේෂික, පූර්ව මීමාංසා, උත්තර මීමාංසා හා ජෛන දර්ශන උගත යුතු විය.
4. ලෞකික විෂය අධ්‍යයන - මේ යටතේ රාජ්‍ය පාලනය, වාණිජ කටයුතු, කෘෂිකර්මය ආදි විෂය ඇතුළත් විය.
5. ලලිතකලා අධ්‍යයන - මේ යටතේ සෞන්දර්ය විෂය මාලාව ඇතුළත් විය.

(පිටු අංක 79 - 82)

(ලකුණු 06යි.)

05.

I. හෙළටුවා - ත්‍රිපිටකය උදෙසා සිංහලෙන් ලියැවුණු අර්ථව්‍යාඛ්‍යාන හෙළටුවා නමින් හැඳින් වේ. හෙළටුවා ග්‍රන්ථ තුනක් ගැන සඳහන් වේ. මහා අට්ඨකථාව ඉන් එකකි. එනම් ප්‍රධාන අටුවාවයි. අනෙක මහාපච්චරියයි. මෙය පඩිවිවකදී ලියූ අටුවාවක් ලෙස සැලකේ. තෙවැන්න කුරුන්දිය යි. මෙය කුරුන්දි වෙල්ලි ප්‍රදේශයේ ලියූවක් සේ සැලකේ. (පිටු අංක 106)

(ලකුණු 06යි.)

II. බුද්ධදත්ත හිමියන් ලියූ අටුවා ග්‍රන්ථ මෙසේ ය. මධුරත්ථවිලාසිනි නමින් හැඳින්වෙන බුද්ධවංස අටුවාව, විනය පිටකය හකුළුවා ලියූ විනය විනිච්ඡය, අභිධර්ම පිටකය හකුළුවා ලියූ අභිධම්මාවතාරය උන්වහන්සේගේ කෘති අතර වේ. අභිධම්මාවතාරය ගද්‍ය හා පද්‍ය යන දෙකින්ම ලියා ඇත. (පිටු අංක 107)

(ලකුණු 06යි.)

III. පෙළ පොත්වලට පසුව රචනා කළ වැදගත් පාලි ග්‍රන්ථ අතර මිළින්ද ප්‍රශ්නය, පේටකෝපදේශය හා නෙත්තිප්පකරණය යන ග්‍රන්ථ ඇතුළත් කළ හැකිය. මිළින්ද ප්‍රශ්නය නාගසේන හිමි හා මිළිඳු රජු අතර ඇති වූ ප්‍රශ්න විසර්ජන ගැන තොරතුරු දැක්වේ. පේටකෝපදේශය හා නෙත්තිප්පකරණය ලියා ඇත්තේ බුද්ධධර්මය ථෙරවාද විභජ්ජවාද ක්‍රමයට අර්ථ විවරණය කරන විධික්‍රම නිරවුල් ව දැක්වීම සඳහාය. (පිටු අංක 102)

(ලකුණු 06යි.)

06.

(I) **සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය** - පුද්ගල විමුක්තිය පිටු දැක විශ්ව විමුක්තිය අවධාරණය කිරීම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාර්ථය යි. කිසිදු විශේෂතාවක් නොදක්වා සමස්ත ලෝක සත්ත්වයාට ම විමුක්තිය උදා කිරීම එහි අරමුණයි. එහි බුදු රජාණන් වහන්සේ මූර්තිමත් කොට දැක්වෙන්නේ විශ්ව විමුක්තියේ ප්‍රතිමූර්තියක් ලෙසටය. විවිධ විචිත්‍ර විෂමතා හා විවිධතා සමාජයෙහි පැවතිය ද ඒ සියලු ජන කොටස්වලටම ශාන්තිය උදා කිරීම බුදුරදුන්ගේ අභිලාෂය විය. මේ ගම්භීර ධර්මය නිර්දේශ කරන සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය විවිධ බෝසත් සිරිත් මඟින් ඒ පණිවුඩය ජන හද ගැඹ තුළ තැන්පත් කළේය. (පිටු අංක 146)

(ලකුණු 06යි.)

(II) **නිච්රෙන් නිකාය** - දහතුන් වන සියවසේදී නිච්රෙන් නම් හිමි නමක විසින් අමිද භක්තිය විවේචනය කරමින් සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය පමණක් නියම බුදුසමය බවත්, ඊට නමු මෙය හෝ රෙංග කෙය්‍ය යනුවෙන් නමස්කාර පාඨය ජප කිරීම ප්‍රමාණවත් බවත් පවසා නව සම්ප්‍රදායයක් ආරම්භ කෙරිණ. ඔහුගේ අනුගාමිකයෝ අද ඔහුට නියම බුදුන් වශයෙන් පුද පූජා කරති. ජපානයේ වඩාත්ම ලෞකික නිකාය සේ සැලකෙන්නේ නිච්රෙන් නිකායයි. (පිටු අංක 149)

(ලකුණු 06යි.)

(III) **සෙන් බුදු සමය** - 12 වන සියවසේ සිට සෙන් බුදු සමය ජපානයට හඳුන්වා දෙනු ලැබීය. ජපන් බෞද්ධ නිකාය අතුරෙන් සුවිශේෂී ස්ථානයක් මෙයට හිමි වේ. සෙන් යන ජපන් වචනය චාන් යන් චීන වචනය අනුව සකස් වූවකි. සෙන් සම්ප්‍රදායයෙහි ජීවය භාවනාවයි. එහෙත් සෙන් යනු හුදු භාවනාව පිළිබඳ අතිරේක අවධාරණයක් පමණක් නොවේ. භාවනාව සමඟ සම්බන්ධ ප්‍රඥා ප්‍රතිලාභය අරමුණු කර ගත් අතිවිශේෂ සංස්කෘතියක් සෙන් මඟින් නිරූපණය වෙයි. අත්‍යන්තයෙන් සියුම් වූත් ගැඹුරු වූත් වින්දන ශක්තියක් සෙන් ජීවන ක්‍රමය මඟින් තීව්‍ර කෙරෙන අතර පරමාර්ථ සත්‍යාධිගමය පිළිබඳ සුවිශේෂ ආකල්පයක් එමඟින් ඉදිරිපත් කර ඇත. එය විශේෂයෙන්ම දෘෂ්ටිවාද - මතිමතාන්තර විෂයෙහි ඇලෙහා මිනිස් මනස ඒවා වෙතින් විමුක්ත කොට විද්‍යා උත්පාදනය පිණිස පවිත්‍ර කිරීමෙහි මූලික බෞද්ධ පරමාර්ථය නිර්හීත ලෙස අවධාරණය කරයි. (පිටු අංක 149 - 150)

(ලකුණු 06යි.)

07.

(I) ලක්වැසියන් අතර පැතිරගිය ථෙරවාද බුද්ධාගම පොදු ජන විශ්වාසවලට අනුකූලව හැඩ ගැසුණු ආකාරය දක්නට ඇත. ප්‍රේතයන්. දෙවියන් හා යකුන් පිළිබඳ අදහස්වලට යොමු වී සිටි ශ්‍රී ලාංකේය සමාජයට යථෝක්ත විශ්වාසවලට ළං වන ආකාරයෙන් පේතවත්ථු, විමානවත්ථු ග්‍රන්ථවල ඇතුළත් ප්‍රේතයන් හා දෙවිවරුන් පිළිබඳ කතාපුවත් ඉදිරිපත් කිරීමට මිහිදු හිමියෝ යොමු වූහ. එසේම වෘක්ෂ වන්දනාවට පුරුදු වී සිටි මෙරට සමාජයට බුදුසමයෙහ ඇතුළත බොධි වෘක්ෂ වනදනාව හදුන්වා දී ඇත. ධාතු පූජාව, ස්තූප හා ස්තූප වන්දනාව මිහිදු හිමියන් මෙරටට ගෙන ආ බුදුසමයේ විශේෂත්වයක් උසුලයි. සිංහල බෞද්ධයන් අතර අද පවා දක්නට ලැබෙන අත පැන් වත් කිරීම මෙරටට පැමිණි බුදුසමයේ විශේෂ ලක්ෂණයක් විය. මේ සිරිත බුද්ධ කාලයේ ද පැවතිණ. අනේපිඩු සිටුතුමා ජේතවනාරාමය බුදුපාමොක් මහසඟනට පූජා කළේ අත පැන් වත් කිරීමෙනි. මිහිදු මාහිමියන් හඳුන්වා දුන් සංස්කෘතිය ශ්‍රී ලංකාවේ ස්ථාපනය වූයේ දසට කුලයක ශිල්පි ශ්‍රේණි ගෙන්වා මෙහි විවිධ බෞද්ධ ගෘහනිර්මාණ. කලාශිල්ප ආදිය ව්‍යාප්ත කිරීමෙනි. මේ සියලු කරුණු මෙහි ථෙරවාද බුදුදහම පැතිර යාමට ඉවහල් විය. (පිටු අංක 173 - 174)

(ලකුණු 06යි.)

(II) අනුරාධපුරයෙන් ආරම්භ වූ බුදුසමය රෝහණය තෙක් පැතිර යාම - දෙවන පෑතිස් රජුගේ කනිටු සොයුරු මහානාග කුමරු අනුරාධපුරයෙන් පලාගොස් රුහුණේ මාගම රාජ්‍යයක් පිහිටුවාගෙන තිබිණ. ඔහුගේ පරපුරෙන් ආ කාවන්තිස්ස රජු කැළණියේ විසූ තිස්ස රජුගේ දියණිය සරණ පාවා ගත්තේය. මේ විවාහය රෝහණයේ ප්‍රබල රාජ්‍ය දෙක එක්සත් කරන්නක් විය. මේ කැළණි රාජවංශය කතරගම දසබෑ රජවරුන් නමින් පැවති රාජවංසය සමග ඥාති සම්බන්ධයක් ගොඩනගා ගත් බව කොටා දැමූ හෙළින් ලද ලෙන් ලිපි ඇසුරෙන් මහාචාර්ය පරණවිතාන හෙළිදරවු කොට ඇත. මේ දසබෑ රජවරු ගෝඨාභය රජු විසින් මරා දමන ලදහ. මේ ඝාතනය නිසා ඇති වූ ජන විරෝධය කාවන්තිස්සගේ විවාහය නිසා තුනී වන්නට ඇත. අනුරාධපුරය සතුරන් අත පැවති සමයේ කාවන්තිස්ස රුහුණේ දේශපාලන බලවේග එකතු කිරීමෙහි නියැලී සිටියේය. ගිරි නුවර හා සේරු යන දෙරටේ රජුන් උපක්‍රම මඟින් තම පක්ෂයට නතු කර ගැනීමට කාවන්තිස්ස ක්‍රියා කළේය. මෙසේ රට එක්සත් කිරීම සඳහා ක්‍රියාත්මක වූ බලවේගය වූයේ බුදුසමයයි. (පිටු අංක 176 - 77)

(ලකුණු 06යි.)

Past Papers Wiki

(III) දුටුගැමුණු රජුගේ කාරය භාරයේ සාඵල්‍යය සඳහා කාවන්තිස්ස රජු අදාළ පසුබිම සකස් කිරීම - තම රාජ්‍යය බලා ගැනීම දුටුගැමුණු කුමරුටත් දිගාමඩුල්ල බලා ගැනීම සද්ධාතිස්ස කුමරුටත් පැවරූ කාවන්තිස්ස රජතුමා සේනාව පිරිවරා ගෙන සේරු නුවරට ගියේ ය. සේරු නුවර දාගැබක් කරවා එහි සර්වඥ ධාතු නිධන් කළේය. මේ සඳහා සේරු හා සෝම යන දෙනුවර රජවරුන්ගේ ද සහය ලැබිණ. මෙසේ උපායශීලි ලෙස ස්තූපය ගොඩනැංවීම මගින් අනෙක් රජුන්ගේ සහාය ලබා ගැනීමට කාවන්තිස්ස සමත් විය. මෙසේ ආගමික පදනමක් මත ජාතිය වික්සත් කිරීමට රජුට හැකි විය. වසේම සේනා සංවිධාන කාර්යයෙහි ද රජු යෙදී සිටියේ ය. මේ අනුව හෙළි වන්නේ දුටුගැමුණු රජුගේ කාරය සාඵල්‍යය සඳහා පසුබිම කාවන්තිස්ස රජු සකස් කළ බවයි. (පිටු අංක 177 - 78)

(ලකුණු 06යි.)

08.

(I) **බෞද්ධ ස්තූප නිර්මාණයේ විශේෂතා** - මෙහිදී සාංචියේ චේතියගිරියේ ථූප නිර්මාණය වැදගත් වේ. ස්තූපය ගල්වැටකින් වට වූ අංගණයක් තුළ පිහිටුවන ලදී. මේ ගල් වැටෙන් අංගණයට අතුළු වීමට ප්‍රධාන දිසා හතරට මුහුණලා දොරටු හතරක් තනා තිබිණ. දොරටු වල විවිධ කැටයම්න් සැරසූ තොරණ හතරක් ද විය. අංගණය මැද උස් වේදිකාවක් මත ස්තූපය තනා තිබිණ. වේදිකාවට නැඟී ස්තූපය ප්‍රදර්ශනා කරමින් පූජා සත්කාර පැවැත්වීමට වන්දනාකරුවන්ට අවස්ථාව හිමි විය. වේදිකාව මුදුනේ පැතලි හැඩයෙන් යුතු අර්ධ ගෝලාකාර හැඩයෙන් දාගැබ නිර්මාණය කෙරිණ. පැතලි මුදුන මත ගල්වැටකින් වට වටවූ හතරැස් කොටුවක් විය. ඒ මැද සිටුවන ලද යෂ්ටියක් මත සවිකළ ඡත්‍රයක් විය. ධාතු නිධන් කර තිබුණේ අර්ධ ගෝලාකාර ගොඩැල්ලේ ඒ සඳහා තැනූ ධාතු ගර්භයක් තුළ ය. ලංකාවේද මුල් කාලයේ තැනූ චෛත්‍යවල මේ ලක්ෂණ දක්නට ලැබිණ. එහෙත් කල් යාමේදී මේ ලක්ෂණ වෙනස් විය. පොළොවෙන් මතුපිට තැනූ වේදිකාව පැවති අතර වැලි අතුරන ලද බාහිර වැලි මලුවක් හා ස්තූපයට ආසන්නයේ පිහිටි ගල් ඇතිරූ සලපතල මලුවක් ද විය. වේදිකාව පේසා වළලු නමින් පසු කාලයේ හැඳින්විණ. දාගබේ ගර්භය මත පිහිටි කුඩා ගල් වැට හතරැස් කොටුව බවට ද ඡත්‍රයට ආධාරක වූ යෂ්ටිය දේවතා කොටුව බවටද පත් විය. ඒ මතු පිට ඡත්‍ර කිහිපයක්ම තැබිණ. පසුව මෙය කොත් කැරැල්ල බවට පත් විය. වී මුදුනේ කොතක් ද පලඳවන ලදී. (පිටු අංක 237 - 38)

(ලකුණු 06යි.)

PAST PAPERS WIKI

(II) **වට්ටාගෙය** - ශ්‍රී ලංකාවේ වටදාගෙය ඉන්දියාවේ වටදාගෙවලට වෙනස් වේ. ඉන්දියාවේ චෛත්‍ය ගෘහය පිහිටි කළුගලින් නිර්මාණය වී ඇත. එහෙත් ලංකාවේ ස්තූපය වටා කළුගල් පේළි දෙකක් සිටුවා වී මත කවාකාර වහලක් ඉදි කිරීමෙන් වටදාගෙය සැකසිණ. එහි බිම සැලැස්ම මුළුමනින්ම කවාකාර විය. එසේම ඉඩකඩ ඇති ප්‍රදක්ෂිණා පථයක් විය. හතර පැත්තෙන්ම මළුවට නැගීම සඳහා පියගැට පෙළ විය. එමෙන්ම සිවු දෙස බලා සිටින බුදු පිළිම හතරක්ද තැම්පත් කර තිබේ. දැනට ශ්‍රී ලංකාවේ ඉතිරි වූ ඇති වටදාගෙවල් ඇත්තේ පොළොන්නරුවේ හා මැදිරිගිරියේය. (පිටු අංක 241 - 42) **(ලකුණු 06යි.)**

(III) **බෞද්ධ ස්තූප වර්ග** - ඝන්ධාකාර, ඝටාකාර, බුබ්බුලාකාර, ධාන්‍යාකාර, පද්මාකාර හා ආමලකාකාර යි.

ඝන්ධාකාර - ඝන්ධාවක හැඩය ඇති ස්තූපයි. 8 - 10 සියවස් වල ලංකාවේ ප්‍රචලිතව පැවතිණ. සියමය, බුරුමය හා ශ්‍රී ලංකාව යන රටවල මේ හැඩයෙන් යුත් චෛත්‍ය බෙහෙවින් ජනප්‍රිය වී ඇති බව සැලකේ.

ඝටාකාර - කළයක හැඩය ඇති ස්තූප වර්ගයයි, කතරගම කිරිවෙහෙර සෝමාවති චෛත්‍යය ආදිය මේ හැඩයෙන් තනා ඇත.

බුබ්බුලාකාර - දිය බුබුලක හැඩය ඇති ස්තූපයි. රුවන්වැලි සෑය, පොළොන්නරුවේ කිරිවෙහෙර හා රන්කොත් වෙහෙරද මේ ගණයට අයත් වේ.

ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩයට කළ චෛත්‍යයි. ථූපාරාමය මුළින්ම මේ හැඩයෙන් තනන්ට ඇතැයි සැලකේ.

පද්මාකාර - පියුමක හැඩය ගත් ස්තූප යි. දැදිගම කොට වෙහෙර පද්මාකාර හැඩයෙන් යුත් ස්තූපයක් සොයා ගෙන ඇත.

ආමලකාකාර - නෙල්ලි ගෙඩියක හැඩයෙන් යුත් චෛත්‍යයි. මේ හැඩයෙන් යුත් චෛත්‍ය ලංකාවෙන් සොයා ගෙන නැතැයි සැලකේ. දැදිගම කොටවෙහෙරින් ආමලකාකාර ධාතු කරඬුවක් ලැබී ඇත. (පිටු අංක 239 - 241)

(ලකුණු 06යි.)

****


රහස්‍යයි

ඇගයීම් ශාලාවෙන් පිටතට රැගෙන යාම තහනම්

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය -

2018 (2019)

-ලකුණු දීමේ පටිපාටිය -



(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

සංකේත අංකය

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ
ප්‍රයෝජනය සඳහා පමණි.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2563 – බෞද්ධ ධර්මාචාර්ය විභාගය – 2018 (2019)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද, **II** වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. **I** කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, **II** කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාරදෙන්න.

වී. ඩී. විද්‍යාපතිරණ
විභාග අංකිෂේඛ්‍ය. විභාග කොමසාරිස්...
ජාතික අධ්‍යාපන හා පුහුණු...
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
සර.මෙව. 1503, කොළඹ 06

I කොටස

1. (i) (අ) පුරාණ තෙරුන් ප්‍රථම සංගීතිය ප්‍රතික්ෂේප කළේ ඇයි?

.....

(ආ) මේ කරුණ සඳහන් ව ඇත්තේ කවර ග්‍රන්ථවල ද?

.....

(ලකුණු 02 යි)

(ii) (අ) ථෙරවාද සම්ප්‍රදායයේ පසුබිම සකස් කිරීමටත් අභිනව නිකායන්හි ආරම්භය සඳහා නැඹුරු වීමටත් හේතු වූ ප්‍රශ්නය කුමක් ද?

.....

(ආ) මේ ප්‍රශ්නය මතු වූයේ කවර අවස්ථාවක දී ද?

.....

(ලකුණු 02 යි)

(iii) (අ) ථෙරා හෙවත් පැරණි පෙළේ භික්ෂූන් වහන්සේගේ මූලිකත්වයෙන් ආරම්භ වූ සංගායනාව කුමක් ද?

.....

(ආ) මේ කාරණය මගින් හෙළි වන්නේ උන්වහන්සේලා තුළ පැවති කවර අරමුණක් ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) රහත් බව හීන අධිගමයක් ලෙස දක්වා ඇත්තේ කවර සංකල්පයක් මගින් ද?

.....

(ආ) මෙහිදී බුද්ධත්වය පමණක් ශ්‍රේෂ්ඨ අධිගමය ලෙස සලකනු ලබන ඉගැන්වීම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(v) (අ) සංඝ සමාජය නිකාය පහකට බෙදී ගියේ කවර රාජ්‍ය සමයකට පූර්වයේ දී ද?

.....

(ආ) මෙහිදී මහායානයෙන් බෙදී ගිය එක් නිකායක් නම් කරන්න.

.....

(ලකුණු 03 යි)

[2 වැනි පිටුව බලන්න.

(vi) (අ) වාත්සීපුත්‍ර හිමියන්ගේ අනුගාමිකයන් බෙදී ගිය නිකාය දෙකක් නම් කරන්න.

(I) .....

(II) .....

(ආ) මේ නිකාය අතුරෙන් වාත්සීපුත්‍ර හිමියන්ගේ මතවාද විමර්ශනය කරමින් ග්‍රන්ථයක් සම්පාදනය කළ නිකාය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(vii) (අ) මහාවස්තුව නමැති ග්‍රන්ථය කවර නිකායකට අයත් කෘතියක් ද?

.....

(ආ) මේ නිකායේ මූලික ඉගැන්වීම දක්වන්න.

.....

(ලකුණු 03 යි)

(viii) (අ) ධර්මයාත්‍රා ක්‍රියාත්මක කළ භාරතීය නරපතියා කවරෙක් ද?

.....

(ආ) ධර්මයාත්‍රා යටතේ මේ රජතුමා සමෘද්ධියට පත් කළ අංග දෙක කවරේ ද?

.....

.....

(ලකුණු 03 යි)

(ix) (අ) බෝධිචර්යාවතාරයේ කතුවරයා කවරෙක් ද?

.....

(ආ) මේ කෘතියෙන් ඉගැන්වෙන මූලික කරුණ කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(x) (අ) අත්ථසාලිනී අට්ඨාව ලියන ලද්දේ කවුරුන් විසින් ද?

.....

(ආ) මේ කෘතියට වස්තු විෂය වූ පාලි නිකාය ග්‍රන්ථය හා එය අයත් වන පිටකය දක්වන්න.

.....

(ලකුණු 03 යි)

**

PAST PAPERS WIKI

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

46473

2563 – බෞද්ධ ධර්මාචාර්ය විභාගය – 2018 (2019)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) අශෝක රජතුමාගේ ධර්මවිජය සංකල්පය කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 04 යි)*
(ii) එතුමාගේ සෙල්ලිපි ඇසුරෙන් මේ සංකල්පය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
(iii) මේ සංකල්පය යටතේ භාරතය තුළ ධර්මප්‍රචාරය සඳහා යෙදූ ක්‍රමෝපාය විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

3. (i) ධර්ම සංගායනාවක් පැවැත්වීම සඳහා කණිෂ්ක රජතුමා යොමු වූ හේතු මොනවා ද? *(ලකුණු 04 යි)*
(ii) මේ සංගායනාව පැවැත්වූ ස්ථානය හා ඊට සහභාගි වූ භික්ෂු පිරිස පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*
(iii) මේ සංගායනාව මඟින් සිදු වූ ප්‍රතිඵල සමාලෝචනය කරන්න. *(ලකුණු 08 යි)*

4. (i) මහායාන හා හීනයාන ද්විභේදය කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 04 යි)*
(ii) ථෙරවාදයෙන් මහායානය බෙදී ගිය ආකාරය ඓතිහාසික සාධක මඟින් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
(iii) මහායාන බුදුසමයේ ඉගැන්වීම්වල පවත්නා ආගමික හා දාර්ශනික අංග දෙක නිදසුන් මඟින් විභාග කරන්න. *(ලකුණු 08 යි)*

5. (i) භාරතයේ බෞද්ධ විශ්වවිද්‍යාල දෙකක් තෝරාගෙන ඒවා පිහිටි ස්ථාන, ආරම්භක රජතුමා හා ප්‍රධාන ආචාර්යවරයා යන කරුණු ඇතුළත් වන සේ කෙටි හැඳින්වීමක් කරන්න. *(ලකුණු 04 යි)*
(ii) මෙම විශ්වවිද්‍යාල දෙකෙන් එකක අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයන් තෝරා ගත් ආකාරය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
(iii) ඉහත (ii) සඳහා ඔබ තෝරා ගත් විශ්වවිද්‍යාලයේ ඉගැන්වූ විෂය ක්ෂේත්‍රය විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

6. (i) මහායානය පැතිර පවත්නා රටවල් දෙකක් තෝරාගෙන ඒවායේ බුදුසමය හඳුන්වා දුන් ආකාරය කෙටියෙන් දක්වන්න. *(ලකුණු 04 යි)*
(ii) මියන්මාරයේ (බුරුමයේ) හෝ කාසිලන්තයේ හෝ ථෙරවාදී බුදුසමයේ ආරම්භය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
(iii) පහත යෙදුම් අතුරෙන් හතරකට කෙටි විවරණ සපයන්න.
(අ) කල්‍යාණි ශිලා ලිපි (ආ) උපාලි මහ තෙරුන් වහන්සේ
(ඉ) කුමාරජීව (ඊ) නමෝ අමිද බුත්සු
(උ) ශ්වේදගොන් (ඌ) හියුං සියැං
(එ) කාශ්‍යප මාතංග හිමි *(ලකුණු 08 යි)*

7. (i) ශ්‍රී ලංකාවේ බුදුදහම ආරම්භ වූ ආකාරය කෙටියෙන් දක්වන්න. *(ලකුණු 04 යි)*
(ii) මිහිඳු මාහිමියන් ශ්‍රී ලංකාවේ පැවැත්වූ ධර්ම දේශනා සඳහා තෝරාගත් පාලි සූත්‍ර සහ ධර්ම ග්‍රන්ථ හඳුන්වා උන්වහන්සේ එබඳු ධර්ම කොටස් තෝරා ගැනීමට හේතු වී යැයි සැලකෙන සාධක පරීක්ෂා කරන්න. *(ලකුණු 06 යි)*
(iii) ශ්‍රී ලංකාවේ පැවැත්වූ ධර්ම දේශනා සඳහා මිහිඳු මාහිමියන් යොදා ගත් භාෂා මාධ්‍යය ඉන්දු ආර්ය ගණයට අයත් සිංහල ප්‍රාකෘතය ද නැති නම් වෙනත් භාෂා ව්‍යවහාරයක් දැයි නිදර්ශන සහිතව විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

8. (i) ගන්ධාර හෝ මථුරා හෝ බුදුපිළිම සම්ප්‍රදාය කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 04 යි)*
(ii) ප්‍රතිමාඝර යනු කවරේදැයි හඳුන්වා ඒවා පිහිටි ස්ථාන දෙකක් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
(iii) බුදුපිළිම නෙළීමේ දී යොදා ගත් විවිධ මුද්‍රා හඳුන්වා, මේවා අතුරෙන් වඩාත් ජනප්‍රිය මුද්‍රා කවරේ දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2018 (2019)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

ලකුණු දීමේ පටිපාටිය හා යෝජිත ආදර්ශ පිළිතුරු

ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න පත්‍රයට නියමිත මුළු ලකුණු 100

I කොටස

1. ප්‍රශ්නය ලකුණු 28

(i) හා (ii) කොටස් සඳහා ලකුණු 02 බැගිනි. සෙසු ප්‍රශ්න සඳහා ලකුණු 03 බැගිනි. මේ කොටසේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වේ.

II කොටස

2 සිට 08 තෙක් ප්‍රශ්නඃ එකකට ලකුණු 18 බැගිනි. මේ කොටසේ එක් අනුකොටසකට ලකුණු (04 + 06 + 08 = 18) 18 බැගිනි.

ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු වේ. (18 x 4 = 72) ලකුණු 72

පිළිතුරු සැපයිය යුතු සියලු ප්‍රහ්න සංඛ්‍යාව 05 කි.

යෝජිත ආදර්ශ පිළිතුරු

I කොටස

1. ප්‍රශ්නය- ලකුණු 28

(i) (අ) භික්ෂූන් සඳහා බුදුරදුන් දී තිබූ අවසර කීපයක් ප්‍රථම සංගීතියෙන් අනුමත කළ විනයෙන් බැහැර වීම. /
(ආ) ධර්මගුප්තිකහ හා මහිංසාසක යන නිකාය දෙකේ ග්‍රන්ථවල. /

(ii) (අ) බුද්ධානුබුද්ධක ශික්ෂාපද. /
(ආ) ප්‍රථම සංගීතියේ දී. /

(iii) (අ) දෙවන ධර්ම සංගායනාව. — 2
(ආ) පැරණි සංරක්ෂණශීලී සම්මතය. — /

(iv) (අ) අර්හත් සංකල්පය. 2
(ආ) මහායාන ධර්මය. /

(v) (අ) ධර්මාශෝක රාජ්‍ය සමයට. 2
(ආ) ඒකව්‍යවහාරික හෝ ගෝකුලික /

(vi) (අ) (i) ධර්මෝත්තරීය හා භද්‍රයානික. /
(ii) සම්මිතීය .හා ෂණ්ණාගාරික. /
(ආ) සම්මිතීයයන්. /

(vii) (අ) ලෝකෝත්තරවාදී නිකාය. - 2
(ආ) බුදුරජාණන් වහන්සේගේ ස්වභාවය ලෝකෝත්තරවූවක් බව. /

(viii) (අ) ප්‍රියදර්ශි/ ධර්මාශෝක රජු. 1
(ආ) ආර්ථික හා සදාචාරාත්මක සමෘද්ධිය. 2

(ix) (අ) ශාන්තිදේව පාද. 2
(ආ) බෝධි චිත්තය. /

(x) (අ) බුද්ධඝෝෂ හිමි. 1 /
(ආ) ධම්මසංගනී, අභිධර්ම පිටකය 2

Past Papers Wiki

II කොටස

යෝජිත ආදර්ශ පිළිතුරු

2. (i) අශෝක රජතුමාගේ ධර්මවිජය සංකල්පය:

බුදුදහම ගැඹුරින් හදාරා ඒ ඇසුරින් සකස් කර ගත් සංකල්ප මේ යටතේ ඇතුළත් වේ. ධර්ම විජය ප්‍රතිපත්තිය රටවැසියාගේ අවනත බව ලබා ගැනීම සඳහාත් ඔවුන්ගේ දෛනික ජීවිතය වර්ධනය කිරීම සඳහාත් යොදා ගෙන ඇත. මෙහි දී බෞද්ධ ආචාරධර්ම හා සමාජධර්ම උපුටා රටවැසියා වෙත ඉදිරිපත් කෙරේ. රජතුමා ද මේ ධර්ම පිළිපැද්දේ ය. මේ ඉගැන්වීම් ක්‍රියාවෙන් පැහැදිලි කළේ ය. රජතුමා මේ සෙල්ලිපිවල කොටා මහජනතාවට ඉදිරිපත් කර තිබේ.

(ලකුණු 04 යි)

(ii) ඉහත සංකල්පය සෙල්ලිපි ඇසුරින් විස්තර කිරීම.

විනය පිටකය, අංගුත්තර නිකාය, මජ්ඣිම නිකාය, සුත්ත නිපාත, සිගාලෝවාද, මංගල, පරාභව ආදි සූත්‍ර ඇසුරින් මේ අදහස් සකස් වී ඇත. මෙවැනි බොහෝ අදහස් එතුමාගේ ගිරිලිපිවල ඇතුළත්ය. සත්ත්වයන්ට හිංසා නොකිරීම හා නොමැරීම නිසා මිනිසුන්ගේ ධාර්මික දියුණුව ඇති වීම, ආධ්‍යාත්මික සංවර්ධනය ධර්මවිජය ප්‍රතිපත්තියෙන් ඇති වීම, බිලිපූජා හා සමජ්ජ වැනි ආගමික උත්සව පැවැත්වීම තහනම් කිරීම, ආදිය මෙහි දී විස්තර කළ හැකි ය.

(ලකුණු 06 යි)

(iii) මේ සංකල්පය යටතේ භාරතය තුළ ධර්මප්‍රචාරය සඳහා යෙදූ ක්‍රමෝපාය:

මේ පිළිබඳ විස්තර අශෝක රජතුමාගේ විවිධ ගිරිලිපි මගින් හෙළි වේ. අලුත් විජිත දිනීම වෙනුවට ධර්මයෙන් ජය ගැනීම. අවිහිංසා ප්‍රතිපත්තිය මගින් සතුන් මැරීම නවතාලීම, මාලිගාවේ මස් පිණිස සතුන් නොමැරීම, (මාඝාතය) මිනිසුන් මෙන් ම සතුන් උදෙසා ද සුබසාධන කටයුතු කිරීම, පරාර්ථ චර්යාවෙහි නියැලීම, දයාව, දානය, සත්‍යය, පිරිසිදු බව ආදි යහපත් ක්‍රියාවන්හි නියුක්ත වීම, තමාට අවමන් කරන අයට පවා සමාව දීම, ඉවසීම පුරුදු කිරීම, ප්‍රත්‍යන්ත දේශ වාසීන් තුළ විශ්වාසය ඇතිවීම, ඔවුන්ගේ බිය තුරන් කිරීම ආදි කරුණු මෙහිදී ඉදිරිපත් කළ හැකි ය. ආගමික සහනශීලතාව යටතේ සියලු ආගම් කෙරෙහි සැලකිලිමත් වීම, වැරදිකරුවන්ට දඬුවම් දී ඔවුන් පුනරුත්ථාපනයෙහි යෙදවීම තවත් වැදගත් අංශ යි. මෙබඳු කරුණු නිදසුන් මගින් පැහැදිලි කිරීම අවශ්‍ය වේ. භාරතයේ ධර්ම ප්‍රචාරය සඳහා ප්‍රදේශ 18කට ධර්ම දූතයන් පිටත් කර යැවීම ද තවත් විශේෂ දෙයකි.

(ලකුණු 08 යි)

(පිටු අංක 18-31)

PAST PAPERS WIKI

3. (i) **කණිෂ්ක රජතමා ධර්ම සංගායනාවක් පැවැත්වීම සඳහා යොමු වූ කරුණු:**

මේ රාජ්‍ය සමයේ දී සංඝ සමාජය විවිධ නිකායවලට බෙදී ඒ ඒ නිකාය පිළිගත් පරිදි ධර්මය ඉදිරිපත් කිරීමට යාම නිසා ධර්මය පිළිබඳ පරස්පර විරෝධී මත ඇති වීම, මෙසේ එකිනෙකට විරුද්ධ මත ඉදිරිපත් කිරීම නිසා රජු ව්‍යාකුලතාවට පත් වීම, මෙසේ පැවති විවිධ මත නිරාකරණය කරමින් බුදුදහම උත්තරීතර තත්ත්වයට නගා සිටුවීම සඳහා ඒ ඒ නිකායාගත පිළිගත් ප්‍රතිපත්ති මත ත්‍රිපිටක ධර්මය විස්තර කිරීමට අදහස් කිරීම.

(ලකුණු 04 යි)

(ii) මේ සංගායනාව පැවැත් වූ ස්ථානය හා සහභාගි වූ භික්ෂු පිරිස:

මේ සංගායනාව පවත්වන ලද්දේ කාශ්මීරයේ ය. සහභාගි වූ වැඩි දෙනා සර්වාස්තිවාදීන් ය. ප්‍රධානත්වය ගත්තේ පාර්ශ්ව හා වසුමිත්‍ර යන ස්ථවිර දෙනම යි. රහතන් වහන්සේලා පන්සිය නමක් ද බෝධිසත්ත්වවරුන් පන්සියයක් ද සාමාන්‍ය බුද්ධිමතුන් දෙසිය පණහක් හෝ එක්දහසක් සහභාගි වූ බව දේශාටන වාර්තාවල දැක්වේ.

(ලකුණු 06 යි)

(iii) මේ සංගායනාව මගින් සිදු වූ ප්‍රතිඵල:

විනය, සූත්‍ර, අභිධර්ම යන පිටකත්‍රය සඳහා ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ ලියවා සෙල්ලිවා මංජූසාවල බහා විශේෂ ස්තූපයක තැන්පත් කරවීමට රජු ක්‍රියා කළේය. මේ ග්‍රන්ථ හැඳින්වෙන්නේ විභාෂා නමිනි. මේ ධර්ම ග්‍රන්ථ ආරක්ෂා කරන ලෙසත් මිථ්‍යා ලබ්ධිකයන් විසින් රටින් බැහැර පැහැර ගෙන යාමට ඉඩ නොලැබෙන ලෙසත් යක්ෂයන් අණ කරවා රැකවරණ ද සලස්වන ලදි. එසේ ම ඉගෙනීමට අවශ්‍ය කෙනෙකුට කාශ්මීර දේශයෙන් බැහැර නොකොට එහි දී ම ඒවා පරිහරණය කිරීමට ඉඩ ප්‍රස්තාව සලසන ලදි. මුල දී සංස්කෘතයෙන් රචිත මේ ග්‍රන්ථ පසු කාලයේ දී චීන භාෂාවට පරිවර්තනය කෙරිණ. විවිධ සම්ප්‍රදායයන් විසින් වෛභාෂික යන නාමය සර්වාස්තිවාදයට භාවිත කරන ලද්දේ විභාෂා ශාස්ත්‍ර ඉගැන්වීම් විෂයෙහි සුවිශේෂ අවධානයක් මොවුන් යොමු කළ බැවිනි.

(ලකුණු 08 යි)
(පිටු අංක: 44-47)

(4) (i) **මහායාන හා හීනයාන ද්විභේදය:**

මහායානයේ බුද්ධ සංකල්පය වැදගත් වේ. එනම් බුද්ධත්වයට පැමිණීමෙන් සංසාර විමුක්තිය ළඟා කර ගැනීම යි. ථෙරවාදයේ අර්හත් සංකල්පය වැදගත් වේ. එනම් බුද්ධ, පච්චෙක බුද්ධ, අරහත් යන ත්‍රිවිධ බෝධි අතුරෙන් එකකට පැමිණ සංසාර විමුක්තියට පැමිණීම යි. මහායනිකයන් බෝසත්වරුන්ට වැඳුම් පිදුම් කරන්නන් මහායානිකයන් ලෙස ද එසේ නොකරන්නන් හීනයානිකයන් ලෙස ද සැලකේ.

(ලකුණු 04 යි)

(ii) ථෙරවාදයෙන් මහායානය බෙදී ගිය ආකාරය:

දෙවැනි ධර්ම සංගායනාව පැවති අවස්ථාවේ දී දස අකැප වස්තුව පිළිගත් විශාල භික්ෂු පිරිසක් සංගීතිකාරක භික්ෂු පිරිසෙන් වෙන් ව වෙන ම සංගීතියක් පැවැත් වූ බව ද ඒ නිසා මේ පිරිස මහාසාංඝික නාමයෙන් හැඳින් වූ බව ද ඓතිහාසික මූලාශ්‍රයන්හි දැක්වේ. රෙවාද සම්ප්‍රදායයේ ප්‍රධානත්වය හිමි වන්නේ භික්ෂූන් වහන්සේට ය. මහාසාංඝිකයන් ගිහියන්ට ද උසස් තත්ත්වයක් ලබා දී ඇත බෝධිසත්ත්ව සංකල්පය අනුව ගිහි-පැවිදි සියලු දෙනා ම බුද්ධාංකුරයෝ ය. මහාසාංඝික සම්ප්‍රදාය ඉදිරිපත් කළ මත හතරක් ඇත, එනම් බුද්ධ සංකල්පය (බුදුරදුන්ගේ අතිමානුෂිකත්වය), අර්හත් සංකල්පය (අර්හත්වය පහත් කොට සැලකීම), ශූන්‍යතා සිද්ධාන්තය හා පුද්ගල නෛරාත්ම්‍යය හා ධර්ම නෛරාත්ම්‍යය (ආත්මයක් නොමැතිකම යන කරුණු යි. මේ සංකල්ප ක්‍රමයෙන් සංවර්ධනය වී මහායානයේ ආරම්භය ඇති විය.

(ලකුණු 06 යි)

(iii) මහායාන බුදුසමයේ පවත්නා ආගමික හා දාර්ශනික අංග දෙක:

ආගමික හා දාර්ශනික යනු මේ අංග දෙක යි. බෝධිසත්ත්ව චර්යාවෙහි මහත්වය ප්‍රකට කෙරෙන්නේ ආගමික අංගයේ උත්කෘෂ්ටතාව ප්‍රකට කරන ස්වරූපයෙනි. මේ යටතේ බුද්ධ චරිතය, බුද්ධ වන්දනා, බෝධි වන්දනා, චෛත්‍ය වන්දනා, ප්‍රදක්ෂිණා හා ආචාර විධි ආදියෙන් සැදී ඇත. මේ අනුව ලලිතවිස්තරය, සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, ජාතකමාලා, බෝධිචර්යාවතාරය, ශික්ෂා සමුච්චය, මහාවස්තු ආදි ග්‍රන්ථ ආගමික අංගයේ වර්ධනයට ඉවහල් වේ. මහායාන බුදුසමයෙහි දාර්ශනික අංගය කෙරෙහි විශේෂ අවධානය යොමු වේ. මේ අංගයේ අග්‍ර ඵලය වනුයේ ශූන්‍යතා හා විඥාන වාද යි. ආචාර්ය නාගර්ජුනපාද වැනි තාර්කිකයන් මේ දාර්ශනික සම්ප්‍රදායයේ වර්ධනයට ඉමහත් සේවයක් කර ඇත. (පිටු අංක 51-56)

(ලකුණු 08 යි)

5. (i) භාරතයේ ප්‍රසිද්ධ බෞද්ධ විශ්ව විද්‍යාල දෙකක් පිළිබඳ විස්තර:

නාලන්දා: රජගහට සැතපුම් හයක් උතුරෙන් පිහිටි ඔරගාමන් ප්‍රදේශයේ පිහිටා ඇත. ශක්‍රාදිත්‍ය හෙවත් පළමු වන කුමාරගුප්ත රජතුමා විසින් ගොඩ නංවන ලදි. ශීලභද්‍ර/ මහතෙර ප්‍රධාන ආචාර්යවරයා විය.

වික්‍රමශිලා: මගධයෙහි ගංගා නදිය අසබඩ පිහිටා තිබිණ. පාල රාජ පරම්පරාවට අයත් ධර්මපාල රජතුමා විසින් කරවන ලදි. ප්‍රධාන ආචාර්යවරයා වූයේ මහාචාර්ය කම්පාල තෙරණුවන්/ දීපංකර ශ්‍රී ඥාන හෙවත් අතිශ තෙර.

ඔදන්තපුර නාලන්දා විශ්ව විද්‍යාලයට සැතපුම් හයක් පමණ නුදුරින් පිහිටියේ ය. ගෝපාල රජු විසින් මේ විශ්ව විද්‍යාලය ආරම්භ කරන ලදි. ප්‍රධාන ආචාර්යවරයා ගැන සඳහන් නොවේ.

සෝමපුර: බංගල දේශයට අයත් ප්‍රදේශයක පිහිටියේ ය. පාල රජ පරපුරට අයත් දේවපාල රජතුමා විසින් ආරම්භ කෙරිණ. ප්‍රධාන ආචාර්යවරයා ගැන සඳහන් නොවේ.

ජගද්දලා: රාමපාල රජතුමා විසින් කරවන ලදි. පිහිටි ප්‍රදේශය හෝ ප්‍රධාන ආචාර්යවරයා ගැන තොරතුරු සඳහන් නොවේ.

වලභී: ඉන්දියාවේ බටහිර ප්‍රාන්තයේ වලභියෙහි පිහිටා ඇත. මෛත්‍රික රජවරුන් විසින් පිහිටුවන ලදි.

(ලකුණු 04 යි)

(ii) ශිෂ්‍යයන් තෝරා ගත් ආකාරය: නාලන්දාව- ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සඳහා තියුණු ප්‍රවේශ පරීක්ෂණයක් විය. ඇතුළු වීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයන් විශ්ව විද්‍යාලයේ ප්‍රධාන දොරටුව අසල නතර විය යුතු ය. මෙහි දී ප්‍රවේශ පරීක්ෂණය පවත්වන ලද්දේ ධර්ම ශාස්ත්‍රයෙහි නිපුණ විවාදයෙහි ප්‍රවීණ පඬිවරුන් විසිනි. පරීක්ෂකවරයා අපේක්ෂකයාගෙන් ගැඹුරු ප්‍රශ්න අසයි. උත්තර දිය නොහැකි ව සමහරු ආපසු හැරී යති. අනෙක් විශ්ව විද්‍යාලවල ද ශිෂ්‍යයන් තෝරා ගැනීම මීට සමාන විය.

(ලකුණු 05 යි)

(iii) ඉගැන් වූ විෂයක්ෂේත්‍රය:

නාලන්දා: විෂය ධාරා පහක් යටතේ අධ්‍යාපනය ලබා දී ඇත. එනම්:

i භාෂා අධ්‍යයන විෂය ධාරාව: භාෂා මාධ්‍යය වූයේ සංස්කෘතය යි. භාෂාව හා බැඳුණු වාග්විද්‍යාව, ඡන්දස්, ව්‍යාකරණ අලංකාර, නිරුක්ති ආදිය හදාළ විය යුතු විය.

ii බුද්ධ ධර්මය අධ්‍යයන විෂය ධාරාව: මේ යටතේ මහායාන ධර්මය අනිවාර්ය විය. සෙසු නිකායවල දර්ශන පිළිබඳ ව පුළුල් දැනුමක් ද ලබා ගත යුතු විය. ශ්‍රාවකයාන බුදුසමය ගැන ද අවබෝධය අවශ්‍ය විය. බුදුසමයෙන් බිහි වූ තන්ත්‍රයානය, මන්ත්‍ර, ධාරණී, යෝග, සමාධි යන අංශවලින් මෙය සකස් විය.

iii දර්ශන අධ්‍යයන විෂය ධාරාව: මේ යටතේ පැරණි සියලු භාරතීය දර්ශන උගත යුතු විය. චතුර්වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද්, ඇතුළත් විය. සාංඛ්‍ය, යෝග, න්‍යාය, වෛශේෂික, පූර්ව මීමාංසා , උත්තර මීමාංසා, යන ෂඩ් දර්ශනය ද, ජෛන සමය ද යෝග ශාස්ත්‍රය ද ශිෂ්‍යයන් විසින් උගත යුතු විය.

iv ලෞකික විෂය අධ්‍යයන විෂය ධාරාව: මේ යටතේ ගිහි ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනයට අදාළ රාජ්‍ය පාලනය, වාණිජ කටයුතු, කෘෂිකර්මය ආදි විෂය විය. ජ්‍යොතිර් ශාස්ත්‍රය, තාරකා විද්‍යාව, ආයුර්වේදය, ආදිය ඉගැන්විණ.

v ලලිතකලා අධ්‍යයන විෂය ධාරාව: සංගීතය, නැටුම්, මූර්ති ශිල්පය, වාස්තු විද්‍යාව, කැටයම් කලාව, කාව්‍ය, නාටක බුදුපිළිම, දේවතා රූප, බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය පිළිබඳ අධ්‍යයන මේ යටතේ විය.

අනෙක් විශ්ව විද්‍යාලවල ද විෂය ධාරාව මීට සමාන ආකාරයෙන් පැවතිණ. (පිටු අංක: 71-96)

(ලකුණු 08 යි)

6. (i) මහායානය පැතිර පවත්නා රටවල් ගණනාවක් ම ඇත. විශේෂයෙන් මධ්‍ය ආසියානු රටවල් මේ යටතට අයත් වේ. මීට අමතර ව චීනය මහායානය පැතිර ගිය වැදගත් රටකි. චීනයේ මුල දී පැවතියේ කොන්ෆියුසියස් හා තාවෝ යන ආගම් දෙක යි. බුදුසමය පැමිණියේ නැගෙනහිර ඉන්දියාවේ සිට ගෝබී කාන්තාරය හරහා වෙසඳ මාර්ග ඔස්සේ ය. ක්‍රි.ව. 62 දී කාශ්‍යප මාතංග නමැති භික්ෂුව චීනයට බුදුදහම රැගෙන ගිය බව විශ්වාස කෙරේ. එනම් මිං අධිරාජයාගේ පාලන සමයේ දී ය. මේ පිරිස රුගේ අනුග(ය ලබා චීනයේ නැවතී සිට මහායයාන සූත්‍ර චීන භාෂාවට පරිවර්තනය කළහ. පසු කාලයේ කුමාරජීව නමැති පණ්ඩිත භික්ෂුව චීනයට වැඩමවා ධර්ම ග්‍රන්ථ චීන භාෂාවට පරිවර්තනය කළේ ය. චීන ජාතික හියං සැයෑං තෙරණුවෝ ද භාරතයට පැමිණ ධර්මය හදාරා ග්‍රන්ථ සමූහයක් රැගෙන ආපසු ගොස් ඒවා චීන බසට පරිවර්තනය කළහ. ගුණවර්මන්, බෝධිධර්ම ආදී තෙරවරු ද චීනයට වැඩමවා බුදුදහම ව්‍යාප්ත කළහ.

කොරියාව: බුදුසමය කොරියාවට පැතිර ගියේ චීනයේ මැංචූරියාව හා යාලු නදිය හරහා බුදුපිළිම හා අගනා දහම් පොත් රැගෙන ගිය ධර්මදූතයන් විසිනි. පළමුවෙන් ම වැඩම කළේ චීන ජාතික සුන්දෝ හිමියන් ය. එවකට කොරියාවේ පාලකයා වූයේ කෝරයි රජතුමා ය. ක්‍රමයෙන් කොරියාව පුරා බුදුසමය ව්‍යාප්ත විය.

ජපන් දේශය: මේ රටට බුදුසමය ලැබුණේ කොරියාවෙනි. ජපන් භික්ෂුණී ශාසනය ව්‍යාප්ත වූයේ ද කොරියාවෙන් ගිය භික්ෂුණියකගේ උත්සාහයෙනි. එනම් ක්‍රි.ව. 577 දී පමණ ය. ක්‍රි.ව. හයවන සියවස මැද භාගයේ ජපානයට බුදුසමය ලැබුණු බව සාමාන්‍ය විශ්වාසය යි. ඈත අතීතයේ සිට ජපානයේ පැවතියේ ෂින්තෝ ඇදහිල්ල යි. කිම්මෙයි අධිරාජයාගේ (ක්‍රි. ව. 539-571) සමයෙහි කොරියාවෙන් බෞද්ධ ග්‍රන්ථ හා ලෝහ බුදු රුවක් රැගත් පිරිසක් ජපානයට පැමිණියහ. මුල දැී ඔවුනට වංශාධිපතීන්ගේ විරෝධතාවලට මුහුණ පෑමට සිදු විය. ක්‍රමයෙන් මේ තත්ත්වය වෙනස් වී බුදුදහම ජනප්‍රිය වෙමින් ජපානයේ පැතිර ගියේ ය. (රටවල් දෙකක් ගැන කරුණු දැක්වීම ප්‍රමාණවත් ය.)

(ලකුණු 04 යි)

(ii) මියන්මාරයේ/ තායිලන්තයේ ථෙරවාද බුදුසමයේ ආරම්භය.

මියන්මාරය: බුරුමයට බුදුසමය ලැබීම ආශ්‍රිත ව ප්‍රවාද කීපයක් ඇත. එකක් නම් බුදුරජාණන් වහන්සේ ධරමාන කාලයෙහි ම මෙහි වැඩිය බවයි. වෙළඳුන් දෙදෙනෙකු විසින් සඳුන් ලීයෙන් තැනූ ආරමයක කාලයක් උන්වහන්සේ වැඩ වාසය කළ බවත් සැකකේ. බුදුරදුන්ට ප්‍රථම දානය පිළිගැන් වූ තපස්සු භල්ලුක දෙපල බුරුම ජාතිකයන් බවත් ඔවුනට ලැබුණු කේහ ධාතු සිංගුත්තර කඳු මුදුනෙහි තැන්පත් කළ බවත් පැවසේ. මෙකල ස්වේදගොන් නමින් හැඳින්වෙන්නේ මේ චෛත්‍යයයි. තෙවන ධර්ම සංගායනාවෙන් පසු සෝණ සහ උත්තර තෙරුන් ස්වර්ණ භූමියට වැඩිය බව වංසකථාවල දැක්වේ. මේ ස්වර්ණ භූමිය බුරුමය ලෙස ද සැලකේ. කෙසේ වෙතත් බුරුමයට බුදුසමය ලැබෙන්නට ඇත්තේ ක්‍රිස්තු පූර්ව පස් වන සියවසේ තරම ය. මෙරටට භාරතයේ සිට පැමිණි සංචාරක වෙළඳුන්ගේ මාර්ගයෙන් බුදුසමය ලැබෙන්නට ඇතැ යි යන තවත් අදහසකි. අනෞරථ නම් බුරුම රජු භක්තිමත් බෞද්ධයෙක් විය.

තායිලන්තය: තෙවන සංගායනාවෙන් පසු සෝණ හා උත්තර තෙරවරුන් ස්වර්ණ භූමියට බුදුසමය රැගෙන වැඩිය බව පැවසේ. මේ ප්‍රදේශය තායිලන්තය වශයෙන් සැලකේ. කෙසේ වෙතත් භාරතීය සංකමණ ඔස්සේ මෙරටට බුදුසමය පැමිණි බව කිව හැකි ය. තායි ඉතිහාසයෙහි රාජධානි තුනක් ගැන සඳහන් වේ. එනම් සුඛෝදය, අයෝධ්‍යා හා බැංකොක් ය. සුඛෝදය රාජධානියේ ආරම්භයේ සිට ම බුරුම්ම රජුන් බුදුසමයේ ආරක්ෂකයන් ලෙස ක්‍රියා කර ඇත.

~~බාම්බෝජය: ක්‍රී. පූ. යුගයේ සිට මෙරට බුදුසමය පැවති බව විශ්වාස කෙරේ. අශෝක යුගයේ දී සෝණ හා උත්තර තෙරුන් මෙරට බුදුදහම හඳුන්වා දුන් බව ද පැවසේ. එසේ වුවහොත් අශෝක යුගයේ සිට මෙරට බුදු දහම ව්‍යාප්ත වූ බව පෙනේ.~~

(ලකුණු 06 යි)

(iii) කෙටි විවරණ සැපයීම:

(අ) කල්‍යාණි ශිලාලිපි: බුරුමයේ ධම්මචෙතිය රජු රජ වීමට පෙර බුරුම තෙරවරුන් පිරිසක් පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලංකාවට පැමිණ උපසම්පදාව ලැබූහ. මෙසේ දෙවිසි නමක් සිව්වන බුවනෙකබා රජුගේ අනුග්‍රහය යටතේ කල්‍යාණි සීමා මාලකයේ දී උපසම්පදාව ලබා ගත්හ. බුරුමයේ කල්‍යාණි ශිලාලිපිවලින් හෙළි වන පරිදි ලක්දිව උපසම්පදාව ලැබූ භික්ෂූන් බුරුමයට වැඩිය පසු කල්‍යාණි සීමා නමින් උපෝසථ කර්ම සිදු කිරීමට සීමා මාලකයක් තැනූ බව මේ ශිලාලිපියේ දැක් වේ.

(ආ) උපාලිතෙරුන් වහන්සේ: උපාලි තෙරුන් ප්‍රමුඛ පිරිස ක්‍රි.ව. 1753 දී ලක්දිවට වැඩමවා සරණංකර හිමියන් ඇතුළු ශ්‍රී ලාංකේය භික්ෂු පිරිසක් උපසම්පදා කළහ. මෙරට ශ්‍යාමෝපාලි මහානිකායයේ ආරම්භය සිදු වූයේ මේ ආකාරයෙනි.

(ඉ) කුමාරජීව: කාශ්මීර ජාතික භික්ෂු නමකි. මේ පණ්ඩිත භික්ෂුව චීනයේ ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා වැඩමවා ගෙන එන ලදි. චීන පඬිවරුන්ගේ ආධාර ඇති ව බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ චීන භාෂාවට පරිවර්තනය කරන ලදි.

(ඊ) නමෝ අමිද බුත්සු: 12/ 13 සියවස්වල ජපානයේ පැතිර ගිය නව ආගමික ව්‍යාපාරයක් ලෙස අමිද භක්තිය හැඳින්විය හැකිය. මේ පිරිස අමිතාභ බුදුන්ට නමස්කාර කිරීමෙන් විමුක්තිය ලැබිය හැකි බව සුඛාවතී ව්‍යූහ සූත්‍රය පදනම් කර ගෙන ඉගැන්වූහ. මේ විශ්වාසය ජපානයට හඳුන්වා දෙන ලද්දේ හෝනෙන් හිමියන් විසිනි.

(උ) ශ්වෙදගොන්: තපස්සු-භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් බුදුරදුන්ගේ කේශධාතු මෙහි තැන්පත් කර චෛත්‍යය බඳින ලද බව සැලකේ. මේ චෛත්‍යය පිහිටා ඇත්තේ පේගු රාජධානියෙහි දාගොන් ප්‍රදේශයේ ය. .මේ කුඩා ප්‍රදේශය සංවර්ධනය වී මෙකල රැංගුන් නාමයෙන් හැඳින් වේ.

(ඌ) හියුං සියෑං : චීන ජාතික බෞද්ධ දේශාටකයෙකි. මෙතුමා භාරතයට පැමිණ නාලන්දා විශ්ව විද්‍යාලයේ වසර ගණනාවක් සිප්සතර හදාරා බෞද්ධ ධර්ම ග්‍රන්ථ 1335ක් පමණ චීන භාෂාවට නැගුහ.

(එ) කාශ්‍යප මාතංග හිමි. ක්‍රි.ව. 62 දී මේ භික්ෂුව තවත් භික්ෂූන් කැටුව චීනයට ගොස් බුදුදහම හඳුන්වා දුන් බව සැලකේ. මෙය සිදු වූයේ චීනයේ මිං අධිරාජයාගේ පාලන සමයේදී ය. මේ දූත පිරිස චීනයේ ශ්වේත අශ්ව විහාරයේ නැවතී සංස්කෘත මහායාන සූත්‍ර චීන භාෂාවට පෙරළා ඇත.

(ලකුණු 08 යි)

(පිටු අංක 120-151)

ස්වර්ණ භූමි තෙවන සංගායනාවෙන් පසු 2 වැනි ලකුණ - 4

7. (i) ශ්‍රී ලංකාවේ බුදුදහම ආරම්භ වූ ආකාරය: බුදුරදුන් ජීවමානකාලයෙහි දී ම තෙවරක් ලංකාවට වැඩම කළ බව වංසකථාවල දැක්වේ තෙවන සංගායනාවෙන් පසු මිහිඳු මා හිමියන් තම දූත පිරිස සමග ලක්දිවට වැඩමවා බුදුදහම හඳුන්වා දුන් බව ඓතිහාසික හා පුරාවිද්‍යා සාධක මගින් හෙයි වේ. උන්වහන්සේ පාලි ත්‍රිපිටකය හා අටුවා රැගෙන මෙරටට වැඩම කළ බවත් මේ අටුවා සිංහල භාෂාවෙන් ලියා තැබූ බවත් ඓතිහාසික මූලාශ්‍රයවල දැක් වේ.

(ලකුණු 04 යි)

(ii) මහිඳු හිමියන් ලංකාවේ දී ධර්ම කොටස් තෝරා ගැනීම.

ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති ඇදහිලි හා විශ්වාසවලට නෑකම් කියන ආකාරයේ ඉගැන්වීම් මුල් කර ගෙන ප්‍රේතවත්ථු, විමානවත්ථු වැනි ග්‍රන්ථවල අදහස් මහජනතාවට ඉදිරිපත් කොට ඔවුන්ගේ ඇදහිලි වෙත් මගකට යොමු කිරීමට මිහිඳු හිමියන් උත්සාහ දරා ඇත. වෘක්ෂ වන්දනාවට පුරුදු ව සිටි ජනතාවට බෝධි වන්දනාව හුරු කරවීමත් ධාතු පූජාව හා ස්තූප වන්දනාව හුරු කරවීමත් මෙහිදී සලකා බැලිය හැකි ය. මෙසේ දහමට හුරු කළ ජනතාවට ක්‍රමයෙන් ගැඹුරු දහම් කොටස් කියා දීමට මිහිඳු හිමියෝ සමත් වූහ.

(ලකුණු 06 යි)

(iii) මිහිඳු හිමියන් යොදා ගත් භාෂා මාධ්‍යය:

මිහිඳු හිමියන් මෙරට ධර්ම දේශනා කිරීමට යොදා ගත් මාධ්‍යය වූයේ සිංහල ප්‍රාකෘතය යි. උන්වහන්සේ උජ්ජයින් දේශයේ ප්‍රාකෘතය හෝ පාලි හෝ වෙනත් ප්‍රාකෘතයකින් ජනතාව අමතන්නට ඇත, එවකට සිංහලය ප්‍රාකෘත අවස්ථාවේ පැවති නිසා උන්වහන්සේගේ දේශනා දෙවනපැතිස් රජු ප්‍රමුඛ ජනතාව අවබෝධ කර ගන්නට ඇත. මෙරට ජනතාවගේ බස් වහර ද ප්‍රාකෘත ගැන හොඳ අවබෝධයක් පැවති මිහිඳු හිමියන් තේරුම් ගන්නට ඇත. මේ අනුව භාෂා දෙක අතර මේ හැර මිහිඳු හිමියන් නෙත් භාෂාවක් යොදා ගත් බවක් නොපෙනේ.

(ලකුණු 08 යි)

(පිටු අංක 158-160, 173-174)

8. (i) ගන්ධාර හෝ මථුරා බුදුපිළිම සම්ප්‍රදාය:

ගන්ධාර: කණිෂ්ක රාජ්‍ය සමයේ ගන්ධාරයේ ඇති වූ බුදු පිළිමය ග්‍රීක-රෝම කලාවේ ආභාසය ඇති ව ඇපලෝ දේව රූපය ගුරු තන්හි තබා ගෙන නිර්මිත ය. බුදුරජාණන් වහන් සේ අත්‍යුත්කෘෂ්ට මහා පුරුෂයෙකු සේ වටහා ගත් ගන්ධාර ප්‍රතිමා ශිල්පියා ඒ සඳහා යෙදිය හැකි සියලු ලක්ෂණ බුද්ධ රූපයට ආරෝපණය කළ බව පෙනේ.

මථුරා: ගන්ධාර ප්‍රතිමාවලට සමකාලීන ව මේ ප්‍රතිමා ද නිර්මාණය කෙරෙන්නට ඇත, මථුරා කලා ශිල්පියා භාරතීය ආභාසය යටතේ බුදු පිළිමය නිර්මාණය කරන්නට ඇත. මථුරා කලා ශිල්පියා බුදුරජාණන් වහන්සේ අධිපති දෙවියෙකු හෝ චක්‍රවර්ති රජෙකු වශයෙන් ඝලකා දේව ප්‍රතිමා හැඩතල උපයෝගි කොට ගෙන බුදුරුව නිර්මාණය කළේය.

(ලකුණු 04 යි)

(ii) ප්‍රතිමාඝරඃ එනම් බුදුපිළිම තබා වන්දනා කළ ගුහා හෝ ගොඩනැගිලි යි. දඹුල්ල ද ප්‍රතිමාවලින් සමනිවිත එවැනි ගුහා ඇතුළත් ස්ථානයකි. ලාංකික කලාශිල්පියා මෙසේ ස්වාභාවික ගුහා තෝරා ගෙන ලෙන් විහාර තැනීය. දොර කවුළු ආදිය යොදා ඉදිරිපස බිත්ති තනා බදාමෙන් පිරියම් කොට මේවා සකස් කර ඇත, ඇතැම් විට පර්වත ප්‍රාන්තවල පිහිටි ගලෙහි ඉදිරියට නෙරා යන ආකාරයේ විශාල බුදුපිළිම තනා ඇත. මේවා ආවරණය සඳහා ප්‍රතිමාඝර තැනීමේ දී පර්වත ප්‍රාන්තය පසුපස බිත්තිය සේ සිටින අයුරින් ඉදිරියෙන් ප්‍රතිමාඝර තනා ඇත. අවුකන, පොළොන්නරුව ගල්විහාරය, බුදුරුවගල වැනි ස්ථානවල මේ ප්‍රතිමාඝර දක්නට ඇත, දෙවයෙන් හා උළුයෙන් තැනූ වහලක් සහිත පිළිම ගෙයක් අනුරපුර ඉසුරුමුනි විහාරයේ දක්නට ඇත.

(ලකුණු 06 යි)

(iii) බුදුපිළිම සඳහා යොදා ගත් විවිධ මුද්‍රාඃ

1. සමාධි මුද්‍රාවඃ ධ්‍යාන මුද්‍රාව නමින් ද හැඳින් වේ. වීරාසන හෝ පද්මාසන ශෛලියෙන් හිඳ උඩ අතට හැරවූ වම් අත්ල මත දකුණු අත්ල පිහිටුවා වැඩ සිටීම ධ්‍යාන මුද්‍රාව යි. උඩු කය කෙළින් තබා ගෙන ඇත,

2. ධර්මචක්‍ර මුද්‍රාවඃ බුදුරදුන්ගේ ධර්ම දේශනා විලාසය සංකේතවත් කෙරෙන්නේ මේ මුද්‍රාව මගිනි. දකුණු අත්ල පිටතට හරවා පපුවේ මට්ටමට තබා ගෙන එහි දබර ඇඟිල්ලේ හා මහපට ඇඟිල්ලේ තුඩු දෙක කවයකි සෑදෙන සේ එකට තබා ඇතුළට හැරුණු වම් අතේ ඇඟිල්ලකි සිපර්ශ කරන අයුරින් පැවතීම ධර්චක්‍ර මුද්‍රාවේ ප්‍රධාන ලක්ෂණය යි.

3. අභය මුද්‍රාවඃ දකුණු අත උඩට නංවා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිග හැර අත්ල ඉදිරිපසට සිටින සේ විවෘත ව හැරීම අභය මුද්‍රාවේ සාමාන්‍ය ලක්ෂණය යි.

4. විතර්ක මුද්‍රාවඃ අත්ල පපු පෙසෙට ප්‍රමාණ වන පරිදි දකුණු අත උඩට නමා දබර ඇඟිල් මාපට ඇඟිල්ල උඩට කවයක් ඇති වන ආකාරයෙන් තබා සිටීම මෙහි ලක්ෂණය යි.

5. භූමිස්පර්ශ මුද්‍රාඃ එනම් පොළොව ස්පර්ශ කරන මුද්‍රාව යි. බෝධිසත්ත්ව හා බුදුපිළිමවලට පමණක් සීමිත ය. හිඳි පිළිමවල පමණක් දක්නට ලැබේ. දකුණු අත දකුණු දණහිස උඩින් අත්ල ඇතුළට සිටින අයුරින් සියලු ඇඟිල් දිග හැර පහතට යොමු ව තිබීම මෙහි විශේෂ ලක්ෂණය යි.

6. වරද මුද්‍රාවඃ දකුණු අත පහත් කොට ඉදිරියට දිග හැර අත්ල ඉදිරියට හරවා ඇඟිලි දිග හැර තිබීම මේ මුද්‍රාවේ ලක්ෂණය යි.

ජනප්‍රිය මුද්‍රා සමාධි, ධර්මචක්‍ර විතර්ක, වරද, මුද්‍රා.

(ලකුණු 08 යි)

(පිටු අංකඃ 230-235)

♦♦♦♦♦♦♦♦

රහස්‍ය යි

පරීක්ෂකතුමා විසින් කුණු දැමී පරීක්ෂාව ඇරඹීමේ මොහොතේ පිටතට පෙනෙන්නේ මේ පත්‍රිකාව

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

ලකුණු දීමේ පටිපාටිය



(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ආයතනික විභාග ඇගයීම් ශාඛාව
පැලවත්ත,
බත්තරමුල්ල.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

පැය තුනයි

අතිරේක කියවීම් කාලය විනාඩි 10යි.

● I කොටසේ ප්‍රශ්නය ද II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු [illegible]

[illegible]
විභාගාධිපතිතුමා වෙත ඇමුණා භාරදෙන්නේ .....
පැලටත්ත, බත්තරමුල්ල.

I කොටස

1. (i) (අ) ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගි නොවී තම ස්වාධීන මතය ඉදිරිපත් කළ යතිවරයා කවරෙක් ද?

.....

(ආ) ප්‍රථම ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූ රජතුමා කවරෙක් ද?

.....

(ලකුණු 02 යි)

(ii) (අ) ථෙරවාදීන් විසින් භාරතයේ පැවැත්වූ සංගායනා ගණන කීය ද?

.....

(ආ) බුද්දානු බුද්දක ප්‍රශ්නය පැන නැගුණේ කවර සංගායනාවේ දී ද?

.....

(ලකුණු 02 යි)

(iii) (අ) ආහාර පිළිබඳ ගැටලුව විනයට ඇතුළත් කොට නැවත ධර්ම සංගීතිය පැවැත්වීමට එකඟ වූ යතිවරයා කවරෙක් ද?

.....

(ආ) මේ බව සඳහන් වන වාර්තා අයත් වන්නේ කවර නිකාය දෙකට ද?

.....

(ලකුණු 03 යි)

(iv) (අ) ථෙරවාදයට පටහැනිව මහාදේව තෙරුන් ඉදිරිපත් කළ සංකල්පය කුමක් ද?

.....

(ආ) මහාදේව තෙරුන් ඉදිරිපත් කළ සංකල්පයෙහි ඇතුළත් කරුණු දෙකක් දක්වන්න.

.....

.....

(ලකුණු 03 යි)

[දෙවැනි පිටුව බලන්න.

උත්තර පත්‍ර පරීක්ෂ
ප්‍රයෝජනය සඳ

(v) (අ) බුද්ධ ශාසනයේ ප්‍රථම නිකාය භේදය ඇති වූයේ කවර රාජ වංස සමයේ දී ද?

.....

(ආ) මෙසේ ඇති වී ගිය නිකායේ නම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(vi) (අ) වාත්සීපුත්‍ර හිමියන් ඉදිරිපත් කළ නව මතය දක්වන්න.

.....

(ආ) වාත්සීපුත්‍ර හිමියන්ගේ නව මතය ප්‍රතික්ෂේප කරමින් රචිත කෘතිය කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(vii) (අ) අශෝක රජු උපත ලැබූයේ කවර භක්තිකයෙකු ලෙස ද?

.....

(ආ) බුදු දහම වැළඳ ගැනීමට ඔහුට උපකාර කළ යතිවරු දෙදෙනා කවුරුන් ද?

.....

(ලකුණු 03 යි)

(viii) (අ) සිවුවන ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූ රජතුමා කවරෙක් ද?

.....

(ආ) විභාෂා ශාස්ත්‍ර ශාස්ත්‍රීය ලේඛන ලෙස සැකසීමට පත් කළ කීර්තිධර බෞද්ධ ලේඛකයාගේ නම කුමක් ද?

.....

(ලකුණු 03 යි)

(ix) (අ) 'දශ භූමි' යනු කවරේ දැයි හඳුන්වන්න.

.....

(ආ) දශ භූමි අතුරින් කරුණු දෙකක් නම් කරන්න.

.....

(ලකුණු 03 යි)

(x) (අ) ඉන්දියාවේ මදුරාසියට ආසන්න බරතිත්ථ විහාරයෙහි සිට ශ්‍රී ලංකාවට පැමිණි ආචාර්යවරයාගේ නම කුමක් ද?

.....

(ආ) උන්වහන්සේ අටුවා සැපයූ ග්‍රන්ථ අතුරින් දෙකක් දක්වන්න.

.....

.....

(ලකුණු 03 යි)

**

[තුන්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

S 4

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

● ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

1. (i) අශෝක අධිරාජයාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) අශෝක රජතුමා ආගමික සහනශීලතා ප්‍රතිපත්තියෙහි යෙදුණු ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ධර්ම ප්‍රචාරය සඳහා අශෝක රජතුමා ධර්ම දූතයන් යැවූ ප්‍රදේශ අතුරින් **තුනක්** නම් කර, එම එක් එක් ප්‍රදේශවලට යැවූ ධර්ම දූතයන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

2. (i) බෝධිසත්ත්ව සංකල්පය හඳුන්වා, එය මහායානා බුදුසමයෙහි වර්ධනයට හේතු වූ ආකාරය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) මහායානයෙහි ඇතුළත් ධ්‍යානී බෝසත්වරුන් පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ශ්‍රී ලාංකේය නරපතියන් දෙදෙනෙකු තෝරාගෙන ඔවුන්ගේ රාජ්‍යසමයන්හි මහායානය බලපෑ ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) භාරතයේ නාලන්දා විශ්වවිද්‍යාලයෙහි ආරම්භය සිදු වූ ආකාරය පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) නාලන්දා විශ්වවිද්‍යාලයෙහි අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය පිරිස පිළිබඳ වර්ගීකරණය කරන්න. *(ලකුණු 06 යි)*

(iii) නාලන්දා විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට පැවති ප්‍රවේශ පරීක්ෂණයේ ස්වභාවය හා එහි තරගකාරිත්වය පිළිබඳ පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) ථේරවාද ආචාර්යවරයෙකු වූ බුද්ධදත්ත හිමියන් විසින් රචිත අටුවා හා සංග්‍රහ ග්‍රන්ථ තුන පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) සුමංගල විලාසිනී, පපංචසූදනී හා මනෝරථපූරණී යන අටුවා ග්‍රන්ථවල කතුවරයා හා ඒවාට පාදක පෙළපොත් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) විනය පිටකය උදෙසා අටුවා ටීකා හා සංග්‍රහ ග්‍රන්ථ ලියූ ආචාර්යවරුන් හා ඔවුන්ගේ කෘති පිළිබඳ සමාලෝචනයක් කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලැබූ බුරුම ජාතික ජප්පට හිමියන්ගෙන් එරට බුදුදහමෙහි ව්‍යාප්තිය උදෙසා ඉටු වූ සේවය ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ක්‍රි.ව. 1339 දී ශ්‍රී ලංකාවෙන් වැඩම කළ භික්ෂූන් වහන්සේලා නිසා තායිලන්තයේ ඇති වූ ශාසනික පුනරුදය පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මහායාන බුදුසමය පැතිර පවත්නා රටවල් **දෙකක්** නම් කොට, ඒවායේ මහායානා බුදුසමය ආරම්භ වූ ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) පණ්ඩුකාභය රාජ්‍ය සමයෙහි ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පය දියුණුව පැවති ආකාරය සාධක මඟින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) බුදුසමය හා රජය අතර සම්බන්ධය මුළු ලක් ඉතිහාසය පුරාම පැතිර පවතින ආකාරය නිදසුන් මඟින් තහවුරු කරන්න. *(ලකුණු 06 යි)*

(iii) වෛතුල්‍ය වාදය හඳුන්වා එය ශ්‍රී ලංකාවට ගෙන ඒම හා එම වාදය ක්‍රමයෙන් ප්‍රතික්ෂේප වීම පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් ලියන්න. *(ලකුණු 06 යි)*

උත්තර පත්‍ර පරීක්ෂකවරු
ප්‍රයෝජනය සඳහා

7. (i) බුදු පිළිම නිර්මාණය ආරම්භ වීමට පෙර ඒ වෙනුවට වන්දනා කිරීමට යොදා ගත් සංකේත පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) තිවංක පිළිම හඳුන්වා ශ්‍රී ලංකාවේ එබඳු පිළිම පිහිටි ස්ථාන පිළිබඳ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ප්‍රතිමාඝර යනු කවරේදැයි විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

* * *

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

ලකුණු දීමේ පටිපාටිය හා යෝජිත ආදර්ශ පිළිතුරු

ලකුණු දීමේ පටිපාටිය

අපේක්ෂකයන් විසින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. I කොටසේ කෙටි ප්‍රශ්න 10කි. ප්‍රශ්න පත්‍රයේම ඒ සඳහා පිළිතුරු සපයා භාර දිය යුතු වේ. II කොටසට අයත් ප්‍රශ්නවලින් හතරකට පිළිතුරු සැපයිය යුතුය.

I කොටසට නියමිත ලකුණු 28කි.
II කොසට නියමිත මුළු ලකුණු 72කි.

මේ අනුව ලකුණු බෙදී යන පිළිවෙළ මෙසේය.

I කොටස ලකුණු 28 යි

1 ප්‍රශ්නය (02 + 02) = 04 + (03 x 8) = 24

II කොටස ලකුණු 72 යි

මේ කොටසේ ප්‍රශ්න 7ක් වේ. එක් එක් ප්‍රශ්නයේ කොටස් තුනකි. එක් කොටසකට ලකුණු 06 බැගින් කොටස් 3ට ලකුණු 18ක් වේ. මේ අනුව ප්‍රශ්න 04 සඳහා ලකුණු 72කි (18 x4).

I කොටස ලකුණු 28 යි
II කොටස ලකුණු 72 යි
මුළු ලකුණු 100 යි

යෝජිත ආදර්ශ පිළිතුරු

I කොටස

1 ප්‍රශ්නය

(i) (අ) පුරාණ තෙරුන්
(ආ) අජාතශත්‍රු රජු (ලකුණු 01 x 2 = 02 යි)

(ii) (අ) තුනකි.
(ආ) ප්‍රථම සංගීතියේදී (ලකුණු 01 x 2 = 02 යි)

(iii) (අ) පුරාණ තෙරුන් (ලකුණු 01 යි)
(ආ) ධර්මගුප්තිකහ හා මහිංසාසක (ලකුණු 01 x 2 = 02 යි)

(iv) (අ) අර්හත් සංකල්පය (ලකුණු 01 යි)
(ආ) රහතන් වහන්සේගේ කාමරාගය, අවිද්‍යාව- සැකය- අනුන්ගේ උපකාරයෙන් සසර තරණය-සමාධියට පිවිසීමේදී කිසියම් වචනයක් ප්‍රකාශ කිරීම. (ලකුණු 01 x 2 = 02 යි)

(v) (අ) නන්ද හා මහාපද්ම යන රාජ වංශ. (ලකුණු 01 x 2 = 02 යි)
(ආ) මහාසාංඝික (ලකුණු 01 යි)

(vi) (අ) පුද්ගල සංකල්පය (ලකුණු 01 යි)
(ආ) කථාවත්ථුප්පකරණය (ලකුණු 02 යි)

(vii) (අ) ජෛන හෝ ආජීවක භක්තිකයෙකු (ලකුණු 01 යි)
(ආ) නිග්‍රෝධ හා උපගුප්ත යන හිමිවරුන් (ලකුණු 01 x 2 = 02 යි)

(viii) (අ) කණිෂ්ක (ලකුණු 01 යි)
(ආ) අශ්වඝෝෂ හිමි (ලකුණු 02 යි)

(ix) (අ) බෝධිසත්ත්වවරයෙකු බුද්ධත්වය ලැබීමට පෙර එක් විය යුතු අවස්ථා (ලකුණු 01 යි)
(ආ) ප්‍රමුදිතා, විමලා, ප්‍රභාකරී, අර්චිස්මතී, සුදුර්ජයා, අභිමුඛී, දුරංගමා, අචලා, සාධුමතීළ ධර්මමේඝා (ලකුණු 01 x 2 = 02 යි)

(x) (අ) ධම්මපාල තෙරුන් (ලකුණු 01 යි)
(ආ) උදාන, ඉතිවුත්තක, විමානවත්ථු, පෙතවත්ථු, ථෙර-ථෙරී ගාථා, චරියා පිටක (ලකුණු 01 x 2 = 02 යි)

II කොටස

1. (i) **අශෝක අධිරාජයාගේ ධර්මවිජය ප්‍රතිපත්තිය:**

දිග්විජය අත් හළ රජතුමා යොදා ගත් ප්‍රතිපත්තියයි. එනම් ධර්මය මගින් ලෝකය ජයගැනීමයි. යුද්ධය නිසා මිනිසුන්, සතුන් හා දේපල විනාශ වේ. අශෝක රජතුමා මෙය අත් දුටුවේය. එනිසා මෙය බැහැර කොට ධර්ම විජය ප්‍රතිපත්තියෙහි යෙදුණේය. හිංසනය වෙනුවට අවිහිංසන ප්‍රතිපත්තිය අනුගමනය කිරීම මෙහිදී දක්නට ලැබේ. සියලු රටවැසියන් තමන්ගේ දරුවන් සේ සැලකීම (ස වෙ මුනිසෙ මම පජා) බෞද්ධ පාලකයෙකුගේ වගකීම සේ සැලකිණ. මේ ආකල්පය සිය දේශය පුරා පැතිරවීම රජුගේ අභිප්‍රාය විය.

අශෝක ගිරි ලිපි අංක 1, 12 හා 13 යන ගිරිලිපිවල මේ කරුණු සඳහන් කෙරේ. (පිටු අංක 24-25)

(හැඳින්වීමට ලකුණු 02ක් ද විස්තර සඳහා ලකුණු 04ක් ද දෙන්න)

(ii) **ආගමික සහනශීලී ප්‍රතිපත්තියෙහි අශෝක රජතුමා යෙදුණු ආකාරය :**

සෑම තන්හිම සියලු ආගමිකයන්ගේ වාසය රජතුමා ප්‍රිය කළේය. මේ ආගම්වල ඉගැන්වෙන සංයමය හා ආධ්‍යාත්මික ශුද්ධිය, කෘතඥතාව, දෘඪ භක්තිය යන මේවා ශ්‍රේෂ්ඨ සේ සලකා ඇත.

ස්වකීය ලබ්ධියට පමණක් ගරු කරමින් අන්‍ය ලබ්ධීන්ට ගර්හා නොකළ යුතුය. අන්‍ය භක්තිකයන්ට ද යම් යම් කාරණා නිසා පිදිය යුතුවේ. එසේ නොකළ හොත් තමන්ගේ ලබ්ධියට උපකාර ද අන්‍ය ලබ්ධිකයන්ට අපකාර ද වේ. තම නිකායට ගෞරව කරමින් අන්‍ය ලබ්ධිකයන්ට නිගා කිරීම තම නිකායට ද හානි පමුණුවා ගැනීමකි. එබැවින් සියලු දෙනා ඔවුනොවුන්ගේ ලබ්ධිය දැන ශ්‍රවණය කිරීම වැදගත් වේ.

දශරාජ ධර්මයෙහි අවිරෝධතා යනුවෙන් හැඳින්වෙන්නේ පරස්පර අදහස් දරන පුදගලයන් සමග සුහදතාවෙන් කටයුතු කිරීමයි. බහු ජාතික හා බහු ආගමික සමාජයක් තුළ ජාතික හා ආගමික සහනශීලතාව වැදගත් වේ. අශෝක රජතුමා සෙල්ලිපි මගින් මේ පණිවුඩය භාරතය පුරා ව්‍යාප්ත කළේය. (ගිරි ලිපි 7, 12, ටැම් ලිපි 6, ආදී ලේඛනවල මේ තොරතුරු දක්වේ. (පිටු අංක 27-29)

(හැඳින්වීමට ලකුණු 02ක් ද විස්තර සඳහා ලකුණු 04ක් ද දෙන්න)

(iii) **අශෝක රජතුමා ධර්ම දූතයන් යැවූ ප්‍රදේශ:**

ධර්ම දූතයන් යැවූ ප්‍රදේශ හැඳින්වෙන්නේ නව රට නාමයෙනි. ඒවා මෙසේය.

රට	ප්‍රධානත්වය
කාශ්මීර-ගන්ධාර	මජ්ඣන්තික තෙරණුවෝ
මහිස මණ්ඩල	මහාදේව තෙරණුවෝ
වනවාස දේශය	රක්ඛිත තෙරණුවෝ
අපරන්ත දේශය	යෝනක ධම්මරක්ඛිත තෙරණුවෝ
මහාරට්ඨ	මහාධම්මරක්ඛිත තෙරණුවෝ
යෝනක	මහාරක්ඛිත තෙරණුවෝ
සුවණ්ණභූමිය	සෝණ උත්තර තෙරවරු
හිමවන්ත ප්‍රදේශය	මජ්ඣිම තෙරණුවෝ
තම්බපණ්ණි	මහාමහින්ද තෙරණුවෝ

මෙයින් රටවල් තුනක් නම් කර ඒවාට යැවූ ධර්දූතයන්ගේ නම් දැක්වීම ප්‍රමාණවත්ය.

(පිටු අංක 38-39)

(එකකට 02 බැගින් ලකුණු 06 දෙන්න. සැ.යු. මෙහි ඇති ප්‍රදේශ යන නාමය වරදවා වටහා ගෙන රටවල් තුනක් දක්වා ඇත් නම් ලකුණු 03ක් පමණක් දෙන්න.)

2. (i) **බෝධිසත්ත්ව සංකල්පය හා එය මහායාන බුදුසමයේ වර්ධනයට හේතු වූ ආකාරය:**

අප හැමදෙනාම බෝධිසත්ත්වයන් වන බවත් බුද්ධයානය මගින් නිර්වාණාවබෝධය කොට ගත හැකි බවත් මෙහි ඉගැන්වේ. මේ පිරිස් මහා කරුණාවෙන් හා මහා ප්‍රඥාවෙන් සමන්විත වේ. සත්ත්වයන් සසර දුකින් ගොඩනැංවීම පිණිස පවත්නා අධිෂ්ඨාන ශක්තිය ඇත. එසේම බෝධිචිත්තයෙන් යුක්ත විය යුතුය. බුදුබව සඳහා ඇති ප්‍රථම මාර්ගය වන්නේ මෙයයි.

බෝධිසත්ත්ව වන්දනාවට මහායාන බුදු සමයෙහි විශේෂ ස්ථානයක් හිමි වේ. මේ අනුව මහායාන බුදුසමයෙහි බෝසත්ත්ව සංකල්පයට විශේෂ ස්ථානයක් හිමි විය. ථෙරවාද සංකල්පය අනුව ප්‍රධාන තැනක් හිමි වන්නේ තමාගේ විමුක්තිය සලසා ගැනීමටයි. ථෙරවාද බෞද්ධයෝ විමුක්තිය සඳහා තුන්තරා බෝධියෙන් එකක් ප්‍රාර්ථනා කරති. එනම් බුදු, පසේබුදු හා මහරහත් යන තුනයි. එහෙත් මහායාන බෞද්ධයෝ විමුක්තිය සඳහා බුද්ධත්වයම පතති. ඒ අනුව ආත්මාර්ථයට වඩා පරාර්ථය සඳහාම වෙහෙසෙති. මේ අදහස මහායානයේ වර්ධනයට හේතු විය.

(පිටු අංක 57-61)

(එක් කොටසකට ලකුණු 03 බැගින් කොටස් දෙකට ලකුණු 06 දෙන්න)

(ii) **මහායානයෙහි ඇතුළත් ධ්‍යානී බෝධිසත්ත්වවරු:**

ධ්‍යානී බෝධිසත්ත්ව යනු මහාස්ථාමප්‍රාප්ත හෝ ත්‍රෛලෝක්‍යවිජයී නමින් හැඳින්වෙන බෝසත්වරුන් අට දෙනයි. බෝසත්වරු ලක්ෂ සංඛ්‍යාත ගණනාවක් ගැන මහායානයේ දක්වේ. මෙයින් තෝරා ගත් ප්‍රධාන අට දෙනා මේ ගණයට අයත් වේ. ඒ මෙසේය.

අවලෝකිතේශ්වර	සර්ව නිවාරණ විෂ්කම්භ
ආකාශ ගර්භ	මෛත්‍රෙය
වජ්‍රගර්භ	සමන්තභද්‍ර
ක්ෂිතිගර්භ	මඤ්ජුශ්‍රී

මෙයින් අවලෝකිතේශ්වර හා මඤ්ජු ශ්‍රී බෝධිසත්ත්ව දෙපළ ප්‍රධාන වශයෙන් ගරුබුහුමන්වලට පාත්‍ර වී ඇත. (පිටු අංක 66-67)

(සමස්තයක් වශයෙන් සලකා ලකුණු දෙන්න. ඉහළ ලකුණක් සඳහා ධ්‍යානී බෝධිසත්ත්වවරුන්ගේ නම් හතරක්වත් තිබිය යුතුය.) **(ලකුණු 06 යි)**

(iii) **ශ්‍රී ලාංකේය නරපතියන් දෙදෙනෙකු තෝරා ගැනීම හා ඔවුන්ගේ කාලවල ඇති වූ මහායාන බලපෑම:**

වෝහාරිකතිස්ස රාජ්‍ය සමය : මෙකල වෛතුල්‍යවාදය ලංකාවට පැමිණියේය. අභයගිරිය මේ මතවාදය ගැන අවධානය යොමු කර ඇත. එහෙත් රජතුමා මේ ඉගැන්වීම්වල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමට ධර්ම-අධර්ම පරීක්ෂාවෙහි නිපුණ ඇමතියෙකු පත්කළේය. ඔහුගේ නිගමනය වූයේ වෛතුල්‍යවාදය අධර්මයක් බවයි. රජතුමා මේ අනුගාමිකයන්ට නිග්‍රහ කොට ඔවුන්ගේ පොත් ගිනිබත් කරවීය.

ගෝඨාභය රාජ්‍ය සමය : මෙකල වෛතුල්‍යවාදය යලිත් ලංකාවට පැමිණියේය. මෙවර වෛතුල්‍යාවාදයේ නායකයා වූයේ සංඝමිත්‍ර භික්ෂුවයි. මොහු මෙහි පැමිණියේ ගෝඨාභය රජු විසින් වෙර ලකුණු ඔබ්බවා රටින් නෙරපනු ලැබූ වෛතුල්‍යවාදී භික්ෂූන් දැක එහි පළිය මහාවිහාරිකයන්ගෙන් ගනිමි යි දිවුරුම් දී බව සඳහන් වේ. ඔහු මෙහි පැමිණ උපායයෙන් රජුගේ සිත් ගෙන රජුගේ පුත් කුමරුවන් දෙදෙනාට ඉගැන්වීම සඳහා අවස්ථාව සලසා ගති. ඔහුගේ අදහස්වලට මහසෙන් කුමරු අවනත කරවා ගැනීමට සමත් විය. සංඝමිත්‍ර ආපසු ගොස් මහසෙන් රජ වූ පසු ලක්දිවට පැමිණ මහාවිහාරයට හිරිහැර කිරීමට පටන් ගති. සෝණ ඇමතියා සංඝමිත්‍රට සහාය දිණි. රටේ මහත් විරොධතාවක් ඇති විය. සෝණ ඇමති හා සංඝමිත්‍ර මරා දමන ලදහ. අනතුරුව මේ කලබලය සංසිඳිණ.

මීට අමතරව සිලාකාල රජු දවස ධරමධාතු නමැති ග්‍රන්ථය පැමිණීම. පළමු වන සේන රාජ්‍ය සමයෙහි මහාසාංඝික නිකායිකයන්ගේ පැමිණීම. සය වන මිහිඳු රාජ්‍ය සමයෙහි ධර්මරුචි නිකායිකයන්ගේ පැමිණීම ආදිය ගැන විස්තර දක්වා ඇත් නම් යෝග්‍ය පරිදි ලකුණු දෙන්න. සිදුවීම් දෙකක් ගැන තිබීම ප්‍රමාණවත්ය. (පිටු අංක 210-213)

(එකකට ලකුණු 03 බැගින් දෙක සඳහා ලකුණු 06කි).

3. (i) **භාරතයේ නාලන්දා විශ්ව විද්‍යාලයේ ආරම්භය සිදු වූ ආකාරය :**

නාලන්දාව පිහිටා ඇත්තේ ඕදන්තපුරයටත් රජගහනුවරටත් අතර පිහිටි බිහාර් ප්‍රදේශයට අයත් කුඩා ගම්මානයකයි. මේ මහා විහාරය ශක්‍රාදිත්‍ය හෙවත් පළමුවන කුමාරගුප්ත රජතුමා විසින් ගොඩනංවන ලදි. මේ රජතුමා ඉදිකළ සංඝාරාමයකින් විහාරය ආරම්භ විය. අනතුරුව රජ වූ බුද්ධගුප්ත. තථාගතගුප්ත. බාලාදිත්‍ය හා වජ්‍ර යන රජවරු විවිධ විහාරාංග ඉදි කොට නාලන්දා මහාවිහාරය පුළුල් කළහ.

දහවන සියවස වන විට නාලන්දාව 10,000කට නේවාසික පහසුකම් සැපයූ අංගසම්පූර්ණ ආයතනයක් විය. මෙහි තනවන ලද ගොඩනැගිලි මහල්වලින් යුක්ත විය. ජනෙල්වලින් බලන කල වලාකුළු කැටි ගැසෙන අයුරු දැක ගත හැකිව පැවතිණ. (පිටු අංක 72-74)

(සමස්තයක් වශයෙන් සලකා ලකුණු 06 දෙන්න.)

(ii) **නාලන්දාවේ අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය පිරිස පිළිබඳ වර්ගීකරණය :**

1. මූලික අධ්‍යාපනය වෙනත් ගුරුකුලයකින් ලබා අවුරුදු 15 සම්පූර්ණ වූ පසු නාලන්දාවට ඇතුළු වූ අවට ප්‍රදේශවල ශිෂ්‍යයන්. මේ අය පුරා 08 වසරක් අධ්‍යාපනය ලැබිය යුතු විය.
2. මූලික හා ද්විතීයික අධ්‍යාපනය නිම කළ වයස අවුරුදු 20 සපිරුණු පසු උපාධි අපේක්ෂකයන් වශයෙන් ඇතුළු වූ පිරිස. අවුරුදු 03ක් පාඨමාලාව හදාරා උපාධිය ලැබීමට මේ අයට හැකි විය.
3. දේශීය හා විදේශීය වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල සිප් සතර හදාරා සිය දැනුම ඔපමට්ටම් කර ගැනීමට හෝ නාලන්දාව ලබා තිබූ කීර්තිය නිසා එම ආයතනයෙහි උපාධිධරයෙකියි පවසා ගැනීමට හෝ සමහරු මෙහි පැමිණියහ. මේ අය පශ්චාද් උපාධි අපේක්ෂකයන් වශයෙන් හඳුනා ගත හැකිය. (පිටු අංක 76-77)

(එකකට ලකුණු 02 බැගින් වර්ග තුනට ලකුණු 06 දෙන්න)

(iii) **නාලන්දාවේ ප්‍රවේශ පරීක්ෂණය හා එහි තරගකාරිත්වය:**

ශිෂ්‍යයන්ගේ ප්‍රවේශ පරීක්ෂණය පැවැත්වූයේ නාලන්දාවේ දොරටුව අසල වූ තෙමහල් ද්වාර මණ්ඩපයෙහිය. ශාස්ත්‍රයෙහි නිපුණ ප්‍රවීණ පඬිවරු අපේක්ෂකයන් පරීක්ෂා කළහ. මේ ශිෂ්‍යයන්ගෙන් සියයට 80ක් පමණ අසමත් වූහ. පරීක්ෂණය ඉතා තරගකාරීවූවක් වූ බව පෙනේ.

මේ අයතනයට ආ ශිෂ්‍ය පිරිස අධිකවීම මේ තරගකාරිත්වයට හේතු වන්නට ඇත. සෑම ශිෂ්‍යයෙකුම සදාචාර සම්පන්න ගතිපැවතුම්වලින් හෙබි යහපත් චරිතයකින් යුක්ත වීම ද අවශ්‍ය වීය.

(පරීක්ෂණයේ ස්වභාවයට ලකුණු 04ක් ද තරගකාරිත්වයට අදාළ හේතු සඳහා ලකුණු 02ක් ද දෙන්න).

4. (i) **බුද්ධදත්ත හිමියන් රචිත අටුවා හා සංග්‍රහ ග්‍රන්ථ තුන:**

අටුවා ග්‍රන්ථ

මධුරත්ථවිලාසිනී: බුද්ධවංස අට්ඨකථාව සඳහා.

පරමත්ථදීපනී: උදාන. ඉතිවුත්තක. විමානවත්ථු. පෙතවත්ථු. ථෙරගාථා. ථෙරීගාථා සහ චරියාපිටක යන පොත් සඳහා.

සංග්‍රහ ග්‍රන්ථ

විනය විනිච්ඡය: විනය පිටකය සඳහා.

අභිධම්මාවතාරය: අභිධම්මපිටකය සඳහා.

උත්තරවිනිච්ඡය: විනය පිටකය සඳහා. (පිටු අංක 107-108)

(අටුවා ග්‍රන්ථ පිළිබඳ විස්තර සඳහා ලකුණු 03ක් ද සංග්‍රහ ග්‍රන්ථ සඳහා ලකුණු 03ක් ද වශයෙන් ලකුණු 06 දෙන්න)

(ii) **අදාළ කරුණු:**

ග්‍රන්ථය	කතුවරයා	පෙළපොත
සුමංගලවිලාසිනී	බුද්ධඝෝෂ හිමි	දීඝනිකාය
පපංචසූදනී	බුද්ධඝෝෂ හිමි	මජ්ඣිම නිකාය
මනොරථපූරණී	බුද්ධඝෝෂ හිමි	අංගුත්තර නිකාය

(පිටු අංක 104-106)

(එක් පොතක් ගැන විස්තර සඳහා ලකුණු 02 බැගින් පොත් තුනට ලකුණු 06 දෙන්න).

(iii) **විනය පිටකය සඳහා අටුවා ටීකා සහ සංග්‍රහ ග්‍රන්ථ ලියූ ආචාර්යවරුන් හා ඔවුන්ගේ කෘති:**

විනය අටුවා ටීකා හා සංග්‍රහ ග්‍රන්ථ	ලියූ ආචාර්යවරුන්	කෘති
අටුවා	බුද්ධඝෝෂ හිමි	සමන්තපාසාදිකා
අටුවා	බුද්ධඝෝෂ හිමි	කංඛාවිතරණී
සංග්‍රහ	බුද්ධදත්ත හිමි	විනය විනිච්ඡය
සංග්‍රහ	බුද්ධදත්ත හිමි	උත්තර විනිච්ඡය
ටීකා	සාරිපුත්ත හිමි	සාරත්ථදීපනී
ටීකා	මහාකස්සප හිමි	විමතිවිනොදනී

(පිටු අංක 107)

(එකකට ලකුණු 01 බැගින් පොත් හයට ලකුණු 06 දෙන්න)

5. (i) ඡප්පට හිමියන්ගේ ශ්‍රී ලාංකේය අධ්‍යාපනය හා බුරුමයේ බුදුදහමේ ව්‍යාප්තියට ඉටු කළ සේවය:

පළමු වන විජයබා රාජ්‍ය සමයෙහි බුරුමයේ අනෞරථ රජතුමා විසින් උත්තරජීව හා ඡප්පට යන හිමිවරු ශ්‍රී ලංකාවට එවන ලදහ. මෙයින් ඡප්පට හිමි වසර දහයක් පමණ ශ්‍රී ලංකාවේ නැවතී ථෙරවාද නය මනාව ඉගෙන ගති. අනතුරුව පෙරළා බුරුමයට වැඩමවා එහි බුදුසමයේ දියුණුවට සේවය කළහ.

බුරුමයේදී මේ හිමි නව සීමාවක් ඉදි කොට සීහල සංඝ නිකාය ආරම්භ කළේය. එරට විසූ පැරණි සංඝයා පුරිම මහණ නාමයෙන් හැඳින්විණ. සීහල සංඝ ක්‍රි.ව. 1190 පමණ වන විට බුරුමයේ ප්‍රබල සම්ප්‍රදාය විය. සීහල සංඝ පරපුර අග්නිදිග ආසියාවේ ථෙරවාද බුදුසමයෙහි ව්‍යාප්තිය සඳහා මහත් සේවයක් සිදු කළේය. මේ මගින් ශ්‍රී ලංකා බුරුම සබඳතාව ද තහවුරු ය. (පිටු අංක 123)

(ඡප්පට තෙරුන්ගේ ශ්‍රී ලාංකීය අධ්‍යාපනය සඳහා ලකුණු 02ක් ද බුරුමයේ සේවය සඳහා ලකුණු 04ක් ද දෙන්න).

(ii) 1339දී ශ්‍රී ලංකාවෙන් වැඩම කළ භික්ෂූන් නිසා තායිලන්තයේ ඇති වූ ශාසනික පුනරුදය:

ලද්‍ය (ලිදයිය) රාජ්‍ය සමයෙහි උගත් ශ්‍රී ලාංකේය භික්ෂූහු තායිලන්තයට වැඩම කළහ. මේ රජතුමා ලංකාවේ ආරණ්‍යක සම්ප්‍රදාය ගැන විශේෂ සැලකිල්ලක් දක්වා ඇත. එවකට ලක්දිව දිඹුලාගල (උදුම්බරගිරි) වැඩ සිටි සංඝරාජ හිමියන් තායිලන්තයට වැඩම කළ අවස්ථාවේ රජතුමා ඇතුළු රටවැසියාගේ ඉමහත් හරසර දක්වා එතුමන් පිළිගෙන ඇත. උන්වන්සේ දිඹුලාගල වැඩ සිටි මේධංකර සංඝරාජයන් වහන්සේ ලෙස පිළිගැනේ. (පිටු අංක 129) **(සමස්තයක් වශයෙන් සලකා ලකුණු 06 දෙන්න.)**

* නාමවාසී සම්ප්‍රදාය පෙළපත ඇරඹියේය. සිංහල
* තායිලන්ත රජුගේ ඇයුම ද ලබාගෙන සිදුකරන ලදී.
නමුත් නිවැරදි, ඇතුළත් කරන්න

(iii) **මහායාන බුදුසමය පැතිර ගිය රටවල් දෙකක් නම් කිරීම හා ඒවායේ මහායාන බුදුසමය ආරම්භ වූ ආකාරය පැහැදිලි කිරීම :**

චීනය, කොරියාව. ජපානය යන රටවල මහායානය පැතිර ඇත.

ඉන්දියාවේ සහ නැගෙනහිර සිට ගෝබී කාන්තාරය හරහා වෙළඳ මාර්ග ඔස්සේ මහායාන බුදුසමය චීනය වෙත ළඟා වූයේය. ක්‍රි. ව. 62දී කාශ්‍යප මාතංග නමැති භික්ෂුව චීනයට බුදුසමය ගෙන ගිය බව විශ්වාස කෙරේ. උන්වහන්සේට පසුව චූපාලන් නමැති යතිවරයා චීනයට ගිය බව සඳහන් වේ. පාරම්පරික මතය වන්නේ අටළොස් දෙනෙකුගේ යුත් දූත පිරිසක් නිල වශයෙන් ඉන්දියාවට යවා එකොළොස් වසරක් බුදුදහම හදාරා චීනයට ගොස් බුදුදහම ව්‍යාප්ත කොට ඇත. පසුව චීන භික්ෂූන් ඉන්දියාවට වරින් වර ගොස් ධර්ම ග්‍රන්ථ ගෙනවුත් චීන බසට පරිවර්තනය කර ඇත. 5 වන සියවසේදී කාශ්මීර ජාතික කුමාරජීව භික්ෂුව චීනයට වැඩමවා බුදුදහම ව්‍යාප්ත කොට ඇත. ෆාහියන් හා හියුං සියැං භික්ෂූන් චීනයෙන් භාරතයට ගොස් ධර්ම ග්‍රන්ථ ගෙන ගොස් ඇත. සයවන සියවසේදී බෝධිධර්ම තෙරණුවෝ චීනයට වැඩමවා බුදුදහම ව්‍යාප්ත කොට ඇත.(පිටු අංක 136-39)

කොරියාවට බුදුසමය හඳුන්වා දෙන ලද්දේ චීනය මගිනි. චීන ජාතික සුන්දෝ හිමියන් ධර්ම ග්‍රන්ථ සමග කොරියාවට වැඩමවා බුදුසමය ව්‍යාප්ත කර ඇත. උතුරු කොරියාවේ ද බුදුසමය ව්‍යාප්ත විය. භාරතීය භික්ෂුවක වූ මාරනන්ද හිමි මෙසේ උතුරු කොරියාවට බුදුසමය හඳුන්වා දී ඇත. (පිටු අංක 140)

සයවන සියවසේදී පමණ බුදුසමය ජපානයේ පැතිර ගියේය. ඓතිහාසික මූලාශ්‍රය අනුව කොරියාව ඔස්සේ ජපානයට බුදුසමය පැමිණි බව සැලකේ. ජපානයේ පැවති ෂින්තෝ ආගමික ඇදහිලි නිසා මුලදී බුදුසමයේ පැතිරීමට බාධා ඇති වුවත් පසුව රජවරු බුදුසමයේ ව්‍යාප්තියට අනුබල දුන්හ. ජපන් බුදුසමයේ වඩාත් ප්‍රසිද්ධ වී ගියේ සෙන් බුදුසමයයි. භාවනාව කෙරෙහි ශ්‍රේෂ අවධානයක් මේ ධර්මයෙහි යොමු වේ. (පිටු අංක 142-147)

(රටවල් දෙකක් දක්වා ඒවායේ බුදුසමය පැතිර යාම ගැන විස්තර සඳහා එකකට ලකුණු 03 බැගින් රටවල් දෙකට ලකුණු 06 දෙන්න).

රටවල් දෙක් දක්වා ලකුණු 3

6. (i) **ශ්‍රී ලංකාවේ ගෘහනිර්මාණ ශිල්පය පණ්ඩුකාභය රාජ්‍ය සමයේ දියුණුව පැවති බව තහවුරු කෙරෙන සාධක :**

චිත්තරාජ හා කාලවේල යක්ෂයන්ට වාසස්ථාන කරවීම. දාසියක මළ පසු දෙවොලක් කරවා දීම. සොත්ථිසාලා නම් ගොඩනැගිල්ලක් තැනවීම. නිගණ්ඨයන්ට වාසස්ථාන කරවා දීම. පරිව්‍රාජකයන්ට ආරාම කරවා දීම. ශිවලිංග පූජාවට ශාලාවක් කරවීම. නොයෙක් මිසදිටු කුල සඳහා ගෙවල් තනවා දීම ආදි පණ්ඩුකාභය රජුගේ කාර්යයන් සැලකීමේදී ගෘහනිර්මාණ ශිල්පය දියුණුව පැවති බව තීරණය කළ හැකිය. (පිටු අංක 154-55)

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 06 දෙන්න).

(ii) **බුදුසමය හා රජය අතර සම්බන්ධය ලක් ඉතිහාසය පුරා පැතිර පැවතීම තහවුරු කෙරෙන නිදසුන් :**

කාවන්තිස්ස රජුගේ විහාරමහාදේවිය සමග ඇති වූ විවාහය නිසා ගෝඨාභය විසින් සිදු කරන ලද ඝාතන පිළිබඳ මහජන විරෝධය තුනී වී යාම, සිය රාජ්‍යය බලා ගැනීම දුටුගැමුණු කුමරුටත් දිගාමඩුල්ල බලා ගැනීම සද්ධාතිස්ස කුමරුටත් පැවරූ කාවන්තිස්ස රජු සේරු නුවරට ගොස් බෞද්ධ කටයුතුවල නිරත වීම, දුටුගැමුණු හා තිස්ස අතර අසමගිය භික්ෂූන් ඉදිරියේ සංසිඳුවා දෙදෙනා අතර සමගිය වර්ධනය කිරීම, දුටුගැමුණු රජුගේ එළාර හා යුදවැදීම බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම, දෙමළුන් ඝාතනය නිසා දුටුගැමුණු රජු තුළ ඇති වූ පසුතැවීම භික්ෂූන් එකතුව දුරු කිරීම, දුටුගැමුණු රජු තම රාජ්‍ය පදප්‍රාප්තියෙන් පසු වෙහෙර විහාර කරවා බුදුසමයේ දියුණුවට ක්‍රියා කිරීම, සිව්වන මිහිඳු රජු සිය පුවරු සෙල්ලිපියෙහි බෝධිසත්ත්වයන් හැර අන් කිසිවෙකුට ලංකා රාජ්‍යය හිමි නැති බව පැවසීම, ක්ෂත්‍රියෙකු රජවන්නේ බුදුරදුන්ගේ පාත්‍රය හා සිවුර රැක ගැනීමට බව සිව්වන මිහිඳු රජු ප්‍රකාශ කිරීම, ශාසන ශෝධනය තම යුතුකමක් සේ සලකා රජවරුන් සංඝයා සමගි කරවීම හා දූෂිතයන් සසුනින් නෙරපීම, ජේතවනය පිළිගත් තිස්ස තෙරුන් සිවුරු හරවා සසුනින් බැහැර කරවීම එවකට සිටි අධිකරණ ඇමති සිදුකිරීම, රාජාභිෂේකය විහාරස්ථාන තුළම සිදු කිරීම පටන් ගැනීම, සිරිසඟබෝ රජු භික්ෂූන් ආශ්‍රයෙහි හැදී වැඩිණි, ධාතුසේන රජු ද එසේය, විජයබාහු රජතුමා අභිෂේකය ලැබුයේ භික්ෂූන්ගේ ආරාධනයෙනි, බෞද්ධයන්ගේ අනුමතිය ලැබීම රාජ්‍ය පාලනයේදී රජුට ඉමහත් රුකුළක් වීම, මහසෙන් රජු මහායානයට උදවු කොට පසුව භික්ෂූන්ගෙන් සමාව ගැනීම ආදිය. (පිටු අංක 176-183)

(එක් කරුණකට ලකුණ බැගින් කරුණු හයකට ලකුණු හයයි)

Past Papers Wiki

(iii) **වෛතුල්‍යවාදය හැඳින්වීම :** ශ්‍රී ලංකාවට ගෙන ඒම හා ක්‍රමයෙන් අභාවයට යාම:

වෛතුල්‍යවාදය පළමු වරට මෙරටට හඳුන්වා දෙන ලද්දේ වෝහාරිකතිස්ස රාජ්‍ය සමයේදීය. වෛතුල්‍ය යන්න වෛපුල්‍ය යන්නට සමාන ලෙස ගෙන එය මහායාන බුදුසමයයැයි පිළිගැනේ. මේ වාදය ගැන තීරණයකට එළඹීමට අමාත්‍යවරයෙක් පත් කෙරිණ. ඔහු මෙය අධර්මයක් සේ තීරණය කළේය. රජතුමා එයට නිග්‍රහ කොට පොත්පත් ගිනිබත් කරවීය.

ගෝඨාභය රාජ්‍ය සමයේ මේ වෛතුල්‍යවාදය රැගෙන යලිත් සංඝමිත්‍ර නමැති භික්ෂුවක් පැමිණියේය. මෙසේ පැමිණියේ ගෝඨාභය රජු වෙර ලකුණු ඔබ්බවා රටින් නෙරපා දැමූ වෛතුල්‍යවාදී භික්ෂූන් දැක එහි පලිය මහාවිහාරිකයන්ගෙන් ගනිමියි දිවුරුම් දී බව ඉතිහාසයෙහි සඳහන් වේ. ඔහු ගෝඨාභය රජුගේ පුත් කුමරුන් දෙදෙනාට ඉගැන්වීමට අවස්ථාව සලසා ගත්තේය. වැඩිමහල් පුත් ජෙට්ඨතිස්ස කුමරු අවනත කර ගැනීමට ඔහු අසමත් විය. එහෙත් කනිටු පුත් මහසෙන් අවනත කර ගැනීමට සමත් වීය. මහසෙන් රජ වූ පසු මහාවිහාරයට අයත් ගොඩනැගිලි නැති කළේය. මහජනතාව කුපිත වූහ. ඔවුන්ගේ කෝපය සංඝමිත්‍රට හා සෝණ ඇමතියා කෙරෙහි යොමු විය. මෙහිදී මේඝවණ්ණාභය ඇමති මැදිහත්ව රජුගේ මේ කාර්ය නවතා දැමීය. සෝණ හා සංඝමිත්‍ර මරා දමනු ලැබූහ. ක්‍රමයෙන් මේ වාදය ප්‍රතික්ෂේප වීය. (පිටු අංක 210-213)

(වෛතුල්‍යවාදය හැඳින්වීමට ලකුණු 02ක් ද එම වාදය පැතිරීම හා ප්‍රතික්ෂේප වීම සඳහා ලකුණු 04ක් ද දෙන්න)

7. (i) **බුදුපිළිම නිර්මාණයට පෙර ඒ වෙනුවට යොදා ගත් සංකේත :**

බුදුරජාණන් වහන්සේ වෙනුවට බෝධිය, චක්‍රාසනය, ත්‍රිරත්නය, සිරිපතුල වැනි සංකේත යොදා ඇත. බුදුපිළිම භාවිතය පැමිණියේ ක්‍රි.ව. ප්‍රථම ශතකයේ පමණය.

(එක් කරුණකට ලකුණු 02 බැගින් කරුණු 03 ක් සඳහා ලකුණු 06 දෙන්න.)

(ii) **තිවංක බුදුපිළිම හඳුන්වා ලංකාවේ එබඳු පිළිම පිහිටි තැන් ගැන විස්තර කිරීම:**

සාමාන්‍ය හිටි පිළිමවලට වඩා වෙනස් වූ පිළිමයි. පහසු ලීලාවෙන් වැඩ සිටින ආකාරයෙන් දණ හිස. ඉඟටිය හා ගෙල යන තුන් තැනින් සිරුර නැමෙන අයුරින් නිරූපණය කෙරෙන ප්‍රතිමා විශේෂයකි. ත්‍රිභංග හෝ තිවංක යන නම්වලින් මේ පිළිම හැඳින්වේ.

මෙබඳු පිළිමයක් පොළොන්නරුවේ පැරණි වේළුවනාරාම ප්‍රතිමා ඝරයෙහි ගඩොළුවලින් තනා තිබී අද ද නෂ්ටාවශේෂ වශයෙන් දක්නට ලැබේ. මේ පිළිම තැනීම මෙරට ශිල්පීන් අතින් කාලාන්තරයක් තිස්සේ සිදු වුණු බව සැළලිහිණි සන්දේශයෙහි ඒ ගැන සඳහන් වීමෙන් ප්‍රකට වේ. (පිටු අංක 229)

(තිවංක පිළිම හැඳින්වීමට ලකුණු 04ක් ද පිහිටි ස්ථාන දැක්වීම සඳහා එකකට ලකුණු 01 බැගින් ලකුණු 02 දෙන්න).

(iii) **ප්‍රතිමාඝර ගැන විස්තර සැපයීම :**

බුදුපිළිම තැන්පත් කිරීමට තැනූ ගෙය ප්‍රතිමා ගෘහයයි. භික්ෂු ආවාස සේ භාවිත වුනු ලෙන් ගුහා බොහොමයක් පසු කලෙක ප්‍රතිමාඝර බවට පත් වී. ලාංකික ශිල්පියා ස්වාභාවික ගුහා තෝරා ගෙන ඒවායේ ලෙන් තනා ඇත. දොරකවුළු ආදිය සහිතව ඉදිරිපස බිත්තිය තනා පර්වත පාදයක් ඇතුළත බිත්ති සේ බදාමෙන් පිරියම් කොට ඒ තුළ බුදුපිළිම එකක් හෝ වැඩි ගණනාවක් පිහිටුවන ලදි. දෑවැන්ත පර්වත ප්‍රාන්තවල පිහිටි ගලෙන්ම ඉදිරියට නෙරා සිටින ආකාරයෙන් ලොකු ප්‍රමාණයේ බුදුපිළිම තනා ඇත. මේවායේ ආවරණ ලෙස ප්‍රතිමාඝර තැනීමේදී පර්වත ප්‍රාන්තය පසුපස බිත්තිය සේ සිටින අයුරින් පර්වත ඉදිරියෙන් ප්‍රතිමාඝර තනන ලදි.

අවුකන. පොළොන්නරුවේ ගල්විහාරය. වැල්ලවාය අසල බුදුරුවගල වැනි ස්ථානවල මේ වර්ගයට අයත් බුදුපිළිම තනා ඇත. (පිටු අංක 234)

(ප්‍රතිමාඝර තොරතුරු සඳහා ලකුණු 04ක් ද ඒවා පිහිටි ස්ථාන දෙකක් සඳහා ලකුණු 02ක් ද දෙන්න)

***

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library